වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2016

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

மக்கள் தோட்ட அபிவிருத்திச் சபை

JANATHA ESTATES DEVELOPMENT BOARD

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2016

ආයතනික දැක්ම හා මෙහෙවර

දැක්ම

ලාභදායී හා ආර්ථික වශයෙන් ශක්තිමත් රාජ්‍ය සංවිධානයක් බවට පත් කරමින් ඉහළම ගුද්ධ විකුණුම් සාමාන්‍ය අගයක් ලභාකර ගනිමින් , කලාපයේ හොඳම මැද රට සාම්ප්‍රදායික තේ නිෂ්පාදකයා බවට පත්වීම.

මෙහෙවර

ආයතනය සතු සම්පත් උපරිම සකසුරුවම්න් හා කැපවීමෙන් යුතුව යොදවා ගනිමින්, කණ්ඩායම් හැඟීමෙන් යුතුව ක්‍රියාකරමින්, අපේක්ෂිත ඉලක්ක සපුරාගනු වස් කාර්යමණ්ඩල කුසලතා සංවර්ධනය තුළින් කර්මාන්තයේ තිරසාර ප්‍රගතියක් ලබාගනිමින් රටේ සුභ සිද්ධිය සඳහා කැපවීම.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව -2016

පටුන

		පිටු අංක
01	ආයතනික තොරතුරු	01-03
02	සභාපති තුමාගේ පණිවිඩය	04-07
03	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	08-09
04	විගණකාධිපති වාර්තාව	10-25
05	**ගිණුම් සටහන්**	
	• ගිණුම් කරන ප්‍රතිපත්ති	26-42
	• මූල්‍ය තත්ව ප්‍රකාශය	43
	• ආදායම් ප්‍රකාශය	44
	• මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය	45-46
	• ගිණුම් සටහන්	47-75
06	2016 වර්ෂයේ විගණන ගිණුම් හා විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග	76
07	2016 වර්ෂය සඳහා ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය	77-84
08	ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශය	85
09	පසුගිය වසර 05 සඳහා සංසන්දනාත්මක තොරතුරු	86
10	ආයතනයේ කාර්යභාරය	87
11	ජනවසම සතු දේපළ ඉඩකඩම් හා ඒවායේ උපයෝජන ස්වභාවය	88-96
12	ආයතන ව්‍යුහය	97
13	මානව සම්පත් පැතිකඩ	98-99
15	මානව සම්පත් සංවර්ධන සැලැස්ම	100-103
14	වාර්ෂික ආයෝජන සැලැස්ම හා ඊට අනුරූප භෞතික හා මූල්‍ය ප්‍රගතිය	104-105

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2016

ආයතනික තොරතුරු

නම	: ජනතා වතු සංවර්ධන මණ්ඩලය
මණ්ඩලය	: 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ සඳහන් කාර්යය සඳහා ඒම පනත යටතේ වූ අංක 199/ඒම හා 1976 පෙබරවාරි 06 දින දරණ ගැසට් නිවේදනය ප්‍රකාරව ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවන ලදී.
ලියාපදිංචි කාර්යාලය	: 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02
විගණකවරු	: විගණකාධිපති
බැංකුකරුවෝ	: ලංකා බැංකුව මහජන බැංකුව පෑන් ඒෂියා බැංකුව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
අධ්‍යක්ෂකවරු	: මහාචාර්ය කෙනඩි ඩී ගුණවර්ධන මහතා - සභාපති (ජනවාරි සිට නොවැම්බර් දක්වා) කීර්ති බී කොටගම මහතා -සභාපති (දෙසැම්බර් සිට) තරික් ඕමාර් මහතා - අධ්‍යක්ෂක නිලූපා කරුණාරත්න මහත්මිය - විධායක අධ්‍යක්ෂක නිලූ දිල්හාර විජේදාස මහතා - අධ්‍යක්ෂක ආනන්ද ගාල්ලගේ මහතා - අධ්‍යක්ෂක දිල්හාර සේනානායක මහත්මිය - භාණ්ඩාගාර නියෝජිත ඒස් ඒම දයාරත්න මහතා - භාණ්ඩාගාර නියෝජිත (සැප්තැම්බර් සිට ඔක්තෝම්බර් දක්වා)

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2016

ජනවසම ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ කණ්ඩායම

01. හිරාන් දුනුවිල මහතා : වැඩබලන සාමාන්‍යාධිකාරී
(ජනවාරි සිට පෙබරවාරි දක්වා)

02. ලලිත් අබේකෝන් මහතා : වැඩබලන සාමාන්‍යාධිකාරී
(මාර්තු සිට)

03. මනෝජ් ධිරසිංහ මහතා : ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (නොවැම්බර් සිට)

04. ශ්‍රීලාල් ගුණසේකර මහතා : මූල්‍ය ප්‍රධානී (නොවැම්බර් සිට)

05. ක්‍රිෂ්මී නානායක්කාර මෙනවිය : අභ්‍යන්තර විගණක (නොවැම්බර් සිට)

06. සම්පත් දයාරත්න මහතා : තක්සේරු නිළධාරි (නොවැම්බර් සිට)

07. එම් සී ප්‍රේමතිලක මහතා : කළමනාකරු - ප්‍රවාහන නඩත්තු

08. කේ ජේ ටී බී රාජසූරිය මහතා : ගණකාධිකාරී

09. එන් රණසිංහ මිය : ගණකාධිකාරිනී

10. ඒස් ඩී ඩබලිව් අලෙන්සු මිය : කළමනාකරු - නීති (ජනවාරි සිට මැයි)

11. ඩබලිව් ඒම් ඊ ඒස් බී කන්දේගම මහතා : කළමනාකරු - නීති (නොවැම්බර් සිට)

12. රොහාන් බඹරදෙනිය මහතා : කළමනාකරු - ප්‍රාදේශීය කාර්යාලය

13. සුනිල් රාජපක්ෂ මහතා : සහකාර අභ්‍යන්තර විගණක

14. එස් ඒ එල් පෙරේරා මහතා : සහකාර ගණකාධිකාරී

15. එච් සී අනුර මහතා : සහකාර කළමනාකරු - වෙළඳ

16. ඩබලිව් ජී පී වාද්දුවගේ : සහකාර කළමනාකරු - අලෙවි

17. කේ ඒ එන් පෙරේරා මහතා : සහකාර කළමනාකරු - ප්‍රවාහන

18. සී ඒච් රැවියල මිය : සහකාර කළමනාකාරිනී - නඩත්තු

19. ආර් ඩබ්. ඒම් ඒම් හලන්ගොඩ මහතා : සහකාර කළමනාකරු - ප්‍රාදේශීය කාර්යාලය

20. නාමල් විජේතුංග මහතා : වැඩබලන කළමනාකරු - වන සම්පත් හා ඉඩම්

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2016

වතු කළමනාකරණ කණ්ඩායම

වතුයාය	භාර කළමනාකරු	භෝගය	ප්‍රමාණය (හෙක්.)	ලිපිනය
බෝපිටිය	කේ ජී එස් කොස්සින්න මහතා	තේ	321.00	දෙල්තොට
බෝහිල්	ඒ එම් ඩී අයි රාජකරුනා මහතා	තේ	490.01	කැටුබුලු
දෙල්තොට	පුබුදු රාජපක්ෂ මහතා	තේ	410.10	ගලහ
ගලබොඩ	ඒ බී ඩි ආර් කුමාර	තේ	752.75	ගලබොඩ
ග්‍රේට්වැලි	ඩී යී කොඩිතුවක්කු මහතා	තේ	465.21	දෙල්තොට
හන්නාන	නිශාන්ත රාජ් මහතා	තේ	1405.63	නුවර
හෝප්	එන් එස් අතුකෝරළ	තේ	654.06	හේවාහැට
කන්දල්ඔය	බී ඩී එස් එල් පෙරේරා මහතා	තේ	930.79	නාවලපිටිය
කොලපතන	සී ඒස් බන්ඩාර මහතා	තේ	361.00	නාවලපිටිය
ලෙවලන්	සී ඩී අළුවිහාරේ මහතා	තේ	1255.92	පුපුරුස්ස
ලුල්කන්දුර	ඒල් බී අබේකෝන් මහතා	තේ	1048.03	දෙල්තොට
මහවිල	හර්ෂ කුමාර මහතා	තේ	293.64	උලපනේ
මවුන්ට්ජීන්	ඒන් හෙට්ටිආරච්චි මහතා	තේ	301.67	වටවල
නාගස්කැන්න	ඒ එස් දයාරත්න මහතා	තේ	506.82	නාවලපිටිය
රහතුන්ගොඩ	ජී ජී පුලසිංහ මහතා	තේ	480.14	හේවාහැට
රුක්වුඩ	අයි එම් ඒ ඩී ඉලංගකෝන් මහතා	තේ	426.67	හේවාහැට
කුමාරවත්ත	ඒස් ඒම් සී බී ඒගොඩවෙල මහතා	රබර්	1822.46	මොනරාගල
පලෙයි	එස් එච් සමරසිංහ මහතා	පොල්	682.19	පලෙයි
දියලුම	ඩබ්.ඒ.ඩී. හරිස්චන්ද්‍ර මහතා	රබර්	204.09	කොස්ලන්ද
තෙලිපොතැන්න	ඒස් ඒම් ඒස් ඩී හුනුගල මහතා	රබර්	85.51	නිකපොත

සභාපතිතුමාගේ වාර්තාව

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31වන් අවසන් වූ වර්ෂය සඳහා මෙම වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ගිණුම් ඉතා සතුටින් ඉදිරිපත් කරමි.

තේ යනු ලෝකයේ පිළිගත් පානයකි. එය ලෝකයේ දෙවැනි ජනප්‍රියතම පානය වේ. මූලිකවම තේ යනු ඕනෑම ස්ථානයකට ගැලපෙන පානයකි. එය අයිස් තේ, උණු තේ, සිසිල් තේ, බෑග් කරන ලද තේ, ලිහිල් තේ ලෙස විවිධ ආකාර වලින් පවතියි.

නිෂ්පාදන මට්ටම්, අපනයනය අඩු වීම, දේශගුණික වෙනස්කම් නිසා මෙම වසර ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ අභියෝගී වසරක් විය. 2016 වසර සඳහා තරහකාරී පරිසරය මඟින් සැලකිය යුතු බලපෑමක් ඇති විය.

2016 වසරේ ශ්‍රී ලංකා තේ මුළු නිෂ්පාදනය කි. ග්‍රෑ. මිලියන 292.4 ක් ලෙස වාර්තා වූ අතර 2015 මෙම කාලයේදී එම අගය කි. ග්‍රෑ. මිලියන 328.8 ක් විය (කි. ග්‍රෑ. මිලියන -36.4). තේ නිෂ්පාදනය කි. ග්‍රෑ. මිලියන 36.4 කින් අඩු වී ඇති නිසා අපනයනය 2015 වසරට සාපේක්ෂව කි. ග්‍රෑ. මිලියන 18.19 කින් පහත වැටී ඇත. මෙමඟින් තේ අපනයනයේ හිඟයක් නිර්මාණය වී ඇත.

2016 වසර සඳහා විකිනූ තේ මුළු ජාතික සාමාන්‍ය කි. ග්‍රෑ. 1 කට රු. 468.61 ($3.22) වූ අතර 2015 සඳහා එම අගය රු. 402.14 ($2.96) (+ රු. 66.47). අඩු වර්ධක තේ වල වෙළඳපොල ප්‍රතිශතය 60% ක් ලෙස වාර්තා වූ අතර 2015 වර්ෂයට සාපේක්ෂව එමඟින් ඉහළම වර්ධනය ලෙස රු. +70.42 ක් වාර්තා විය. මධ්‍යස්ථ වර්ධක ප්‍රභේද වල වර්ධනය රු. 9 + 57.02 ක් වූ අතර අඩු වර්ධක තේ වල වර්ධනය (රු. +61.47) ක් විය. අඩු වර්ධක වල සාමාන්‍ය රු. 486.74 ක්ද මධ්‍යස්ථ වර්ධක වල සාමාන්‍ය රු. 419.59ක් ලෙසද අධි වර්ධක වල සාමාන්‍ය රු. 449.85ක් ලෙසද 2016 ජනවාරි සිට දෙසැම්බර් අතර කාලය සඳහා වාර්තා විය.

2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ තේ අපනයනය කිලෝ මිලියන 288.88 ක් විය. මෙය පසුගිය වසරට සාපේක්ෂවකිලෝ මිලියන 18.19ක පහත වැටීමකි.

තේ වෙළඳපොල වාර්තා වලට අනුව ශ්‍රී ලංකා තේ සඳහා ඉහළම ඉල්ලුම රුසියාවෙන් ලැබෙන අතර අනතුරුව ඉරානයෙන් හා ඉරාකයෙන් ශ්‍රී ලංකා තේ සඳහා ඉල්ලුමක් ඇත.

2016 ජනවාරි සිට දෙසැම්බර් අතර කාලයේදී මුළු අපනයන ආදායම රු. බිලියන 184.78 ක් වූ අතර එම අගය පසුගිය වසරට සාපේක්ෂව රු. බිලියන 2.72 ක සුළු වර්ධනයක් (+1.50%) පෙන්නුම් කරයි.

පහතවැටෙන තෙල් මිල පිළිබඳ ද්විත්ව කම්පන සහ බටහිර සම්බාධක අක්‍රමවත්ව පැවතියද රුසියානු ආර්ථිකය පසුගිය වසරේදී වේගවත් වී තිබේ.

වාර්ෂික වාර්තාව - 2016

ශ්‍රී ලංකාව ඔසින් 2016 වසරේදී තේ අපනයනය කල රටවල් 10 අනුයිළිවෙලට සැකසූ විට, රුසියාව (ඩොලර් මිලියන 611.9 සහ මුළු අපනයන වලින් 10.3%), ඇමරිකා එක්සත් ජනපදය (ඩොලර් මිලියන 468 සහ මුළු අපනයන වලින් 7.9%), එක්සත් රාජධානිය (ඩොලර් මිලියන 400.9 සහ මුළු අපනයන වලින් 6.8%). සෞදි අරාබිය (ඩොලර් මිලියන 255.7 සහ මුළු අපනයන වලින් 4.3%), ඉරානය(ඩොලර් මිලියන 251.3 සහ මුළු අපනයන වලින් 4.2%), මොරොක්කෝව(ඩොලර් මිලියන 232.7 සහ මුළු අපනයන වලින් 3.9%), ජර්මනිය (ඩොලර් මිලියන 221.7 සහ මුළු අපනයන වලින් 3.7%), ජපානය(ඩොලර් මිලියන 174 සහ මුළු අපනයන වලින් 2.9%), ප්‍රංශය(ඩොලර් මිලියන166.2 ක් සහ මුළු අපනයන වලින් 2.8%), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (ඩොලර් මිලියන 163ක් සහ මුළු අපනයන වලින් 2.7%).

ශ්‍රී ලංකාව ලෝකයේ තේ අපනයනකරුවන් අතර තෙවන ස්ථානයේ පසුවේ.

2016 වසර තුල තේ වතුයායන් 13ක්, තේ කර්මාන්තශාලා 4 ක්‍රබර් වතු 3ක් සහ පොල් වතුයායන් 1ක් මෙහෙයවීම සිදු විය.

2016 වසර සඳහා තක්සේරු කරන ලද අස්වැන්න (සැකසූ තේ) කි.ග්‍රෑම් 2,271,900 ක් විය. එම කාල සීමාව සඳහා ලබා ගත් සත්‍ය අස්වැන්න කි. ග්‍රෑම්. 1,314,089.5 ක් වූ අතර වෙනස ලෙස -42.16% ක් වාර්තා විය. 2016 වසර සඳහා මුළු නිෂ්පාදන පිරිවැය සාමාන්‍ය රු. 473.97 ක් ලෙස තක්සේරු කල අතර සත්‍ය අගය රු. 602.81ක් ලෙස වාර්තා විය. 2016 වසර සඳහා මුළු විකුණුම් සාමාන්‍ය රු. 293.75ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබූ අතර සත්‍ය අගය රු. 326.61ක් ලෙස වාර්තා විය.2016 වසර සඳහා මුළු අස්වැන්න කි. ග්‍රෑම්. (සැකසූ තේ) 2,271,900 ක් ලෙස ඇස්තමේන්තු කල අතර වාර්තා වූ සත්‍ය අගය කි.ග්‍රෑම්.1,314,090 විය. 2016 සඳහා හෙක්ටෙයාර් 1ක අස්වැන්න කි.ග්‍රෑම්. 619 ක් ලෙස තක්සේරු කරන ලද අතර සත්‍ය අගය කි. ග්‍රෑම්. 358 ක් විය. 2016 වසර සඳහා කි. ග්‍රෑම්. 1ක නිෂ්පාදන පිරිවැය රු. 473.97 ක් ලෙස තක්සේරු කර තිබුණු අතර සත්‍ය අගය ලෙස රු. 602.81ක් වාර්තා විය. 2016 වසර සඳහාකි. ග්‍රෑම්. 1ක විකුණුම් මිල 293.75ක් ලෙස තක්සේරු කර තිබුණු අතර සත්‍ය අගය රු. 326.61ක් ලෙස වාර්තා විය. 2016 වසරේ කි. ග්‍රෑම්. 1ක ලාභය/ අලාභය ලෙස රු. (180.22)ක් තක්සේරු කර තිබුණු අතර සත්‍ය අගය ලෙස රු. (276.20)ක් වාර්තා විය. 2016 වසර සඳහා ශුද්ධ ලාභය/ අලාභය රු. (425,605,201) ක් ලෙස තක්සේරු කර තිබුණු අතර සත්‍ය අගය රු. (383,844,742) ක් විය.

මෙම කාලය තුල රබර් වතුයායන් 3ක් පවත්වා ගෙන ගොස් ඇති අතර ඒවා නම් කුමාරවත්ත, දියලුම සහ තෙලිපතැන්න වේ. 2016 වසර තුල කුමාරවත්ත වතුයායේ, දියලුම වතුයායේ සහ තෙලිපතැන්න වතුයායේ අස්වැන්න පිලිවෙලින් කි. ග්‍රෑම්. 309,306 , 29,478 සහ 13,478 ක් විය. අවම ලාභය/ අලාභය දියලුම වතුයායෙන් වාර්තා වූ අතර එම අගය රු. (1,821,151) ක් විය. ඉහළම ලාභය/ අලාභය කුමාරවත්ත වතුයායෙන් වාර්තා වූ අතර එම අගය රු. (17,874,794) ක් විය. රු. 271.38 ක් වූ අවම නිෂ්පාදන පිරිවැය කුමාරවත්ත වතුයායෙන්ද රු. 546.38 ක් වූ උපරිම නිෂ්පාදන පිරිවැය තෙලිපතැන්න වතුයායෙන්ද වාර්තා විය. අවම ශුද්ධ විකුණුම් සාමාන්‍ය ලෙස රු. 204.69 ක් තෙලිපතැන්න වතුයායෙන්ද උපරිම ශුද්ධ විකුණුම් සාමාන්‍ය ලෙස රු. 206.00 දියලුම වතුයයෙන්ද වාර්තා විය.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශ වල සාමාන්‍ය වැටුප් ඉහල ගොස් ඇත. මෙම ඉහළ යාමට ප්‍රධානතම හේතුව 2015 වසර තුල ක්‍රියාත්මක වූ පියවර ලෙස වැඩි වූ රු. 10,000 ක දීමනාව සහ 2016 අප්‍රේල් 25 වන දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව අතුරු දීමනාවෙන් කොටසක් මූලික වැටුපට අන්තර්ගත කිරීම නිසා වේ. ඉහත චක්‍රලේඛය නිසා සියලු ව්‍යවස්ථාපිත දායකත්වයන් (EPF, ETF, Gratvity) සහ අතිකාල දීමනා ස්වයංක්‍රියව ඉහළ ගොස් ඇති අතර ආයතනයේ වැටුප් බිලට සහ වාසිදායක තත්ත්වයන්ට සෘජුවම බලපෑම් ඇති කරයි.

වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජයට අයිති ආයතන වල නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම පිළිබඳ පවතින 2016 ඔක්තෝම්බර් 27 දිනැති අංක PED 1/2015 දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය අනුව රු. 20,000 කින් වැඩි විය. මෙම ඉහළ යාම ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවක වේතන බිල සහ වාසිදායක තත්ත්වයන් කෙරෙහි සෘජුවම බලපා ඇත.

2016 වසර සඳහා වන වතු සේවක සාමූහික වැටුප් ගිවිසුම (තේ හා රබර් වගාව සහ විකිණීම)2016 ඔක්තෝම්බර් මස 18 වන දින වෘත්තීය සමිති විසින් අත්සන් කරන ලද අතර 2016 ඔක්තෝම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක විය. මෙමඟින් ඉහළ යන සංස්ථාපිත දායකත්වයන්, වතු සේවකයින්ගේ අතිකාල දීමනා ආදිය කෙරෙහි ගැටළු ඇති කල අතර අවසානයේ එය වැටුප් බිලට හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සමස්ත වාසිදායක තත්ත්වය කෙරෙහි බලපෑම් ඇති කරන ලදී.

වතු සේවකයින් සඳහා වර්තමානයේ පවතින සාමූහික ගිවිසුම 2016 සැප්තැම්බර් මස 3 වන දින කල් ඉකුත් විය. කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය සහ අනුබද්ධ උපාධිධාරීන්ගේ වැටුප් විධිමත් කිරීම සඳහා ලංකා වතු සේවක සංගමය (CESU) සමඟ නව ගිවිසුමක් ඇති කර ගත යුතුය. එය ජනතා වතු සංවර්ධන මණ්ඩලය කෙරෙහිද සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එම සඳහන් කරන ලද ගිවිසුම අනුව 2017 මාර්තු 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි වැටුප 25% කින් වැඩි කිරීමට සම්මත වී ඇති අතර වැටුප් වර්ධකය එම වසර තුළම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. මෙම වැඩිවීම ජනතා වතු සංවර්ධන මණ්ඩලය කෙරෙහිද විශාල වගකීමක් ඇති කරයි. වැටුප් වැඩි කිරීමත් සමඟම එය ක්‍රියාත්මක කිරීමද සිදු විය. අතිකාල දීමනා, ව්‍යවස්ථාපිත දායකත්වයන් (EPF, ETF, Gratvity) ආදියද ස්වයංක්‍රියව ඉහළ ගියේය. ජනතා වතු සවර්ධන මණ්ඩල පනත සැලකිමේදී වෙළඳපොල අවශ්‍යතා සමඟ ගැලපීමට මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් විවිධ අංශවලින් නියෝජනය විය යුතුය.

අවසාන වශයෙන් මා විසින් කර්මාන්ත ශාලා ගිණුම්, අවසාන ගිණුම් අධ්‍යනය කරන ලද අතර ප්‍රධාන ශාඛාව, ප්‍රාදේශීය ශාඛා සහ කර්මාන්තශාලා අධ්‍යනය කරන ලදී. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, වාර්තාව සකස් කරන කාලය වන විට ඉතා අර්බුදකාරී තත්ත්වයක පවතින බව හඳුනා ගෙන ඇත. වර්තමාන තත්ත්වය සැලකිමේදී ආයතනය සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අවශ්‍ය බව දැඩිව නිර්දේශ කර ඇත. (වැඩි සේවකයින් සඳහා ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන ක්‍රමයක් (VRS) හඳුන්වා දීම, තේ ඉඩම්, අවදානම්, අඩු අවදානම්, මධ්‍යස්ථ, සාමාන්‍ය, ලාභ උපයන ආදී ලෙස වර්ග කිරීමට නියමිත අතර භාවිතා නොකරන කාර්යාල ප්‍රදේශ බදු දීමට හෝ ඉපයිය හැකි ආකාර හඳුනා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම). ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ආසන්න වශයෙන් රු. මිලියන 3000ක් අවශ්‍ය වේ. අපේක්ෂිත ප්‍රාග්ධන ආයෝජනය ලභා කර ගත නොහැකි වුවහොත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ එහි සේවකයින්ට තවදුරටත් පැවැත්මත් නොමැත.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2016

පවත්වා ගැනීමේ දැඩි ගැටළු වලට මුහුණ දීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහ එමඟින් රාජ්‍ය භාණ්ඩාගාරයේ අවධානය ගැනීමට අවශ්‍ය පියවර ජනතා වතු සංවර්ධන මණ්ඩල කළමනාකාරීත්වය මඟින් ගත යුතුය.

තවද, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කරණයේ අත්‍යාවශ්‍ය අංශ ලෙස ව්‍යුහයන් වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමුකරන කාර්ය සාධනය මැනීම සඳහා අභ්‍යන්තර ආයතනික පාලනය ක්‍රියාවට නැංවීමට විවිධාංගීකරණය වූ පදනමක් මත විශ්වස්නීය ප්‍රතිව්‍යුහගත කිරීමකට මම නරයේ නිර්දේශ කරමි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් මම ගරු අමාත්‍යතුමාට,වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට , ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කළමනාකරණ සමූහයට ,කර්මාන්තශාලා/ වතු පාලකයින් සහ සේවක මණ්ඩලයට , තැරැවිකරුවන්ට,පාරිභෝගිකයින්ට,ලංකා වැවිලි කරුවන්ගේ සංගමයට සහ වෘත්තීය සමිති වලට,ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අභිවෘද්ධිය වෙනුවෙන් මුළු දවස පුරා දක්වන ලද කැපවීම හා නොබිඳුනු ශක්තිය වෙනුවෙන් හදවතින්ම ස්තූතිය පිරිනමමි.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ඉදිරි ගමන වෙනුවෙන් වැදගත් උපදෙස් ලබා දෙන අධ්‍යක්ෂක මණ්ඩලයට මාගේ කෘතවේදීත්වය පලකර සිටිමි.

කීර්ති සී කොටගම
සභාපති
ජනතා වතුසංවර්ධන මණ්ඩලය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2016

විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර්තාව

විගණන කමිටු රැස්වීම් වාර්තාව

ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා මූල්‍ය වාර්තා කරන පද්ධතිය හා පාලනයන් කාර්යක්ෂමව කර ගෙන යාමට අභ්‍යන්තර විගණනය හා බාහිර විගණන අංශයන්ගෙන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා පසු විපරම්.කටයුතු කිරීම.

කමිටුවේ සංයුතිය

ස්වාධීන විධායක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් මෙය සමන් විත වන අතර ,මණ්ඩලයේ අරමුණු හා කාර්යයන් විධිමත්ව යන පාලනයෙන් යුතුව පවත්වාගෙන යාමට මෙම කමිටුව ස්ථාපිත කර ඇත.

එස්.එම්. දයාරත්න මහතා	:- සභාපති (මහා භාණ්ඩාගාර නියෝජිත)
නිලූ දිල්හාරා විජේදාස මහතා	:- විධායක ස්වාධීන අධ්‍යක්ෂ
ගාල්ලෙ ආරච්චි මහතා	:- විධායක ස්වාධීන අධ්‍යක්ෂ
එම්.පී.කුමාර මහතා	:- රජයේ විගණන අධිකාරී
ක්‍රිෂ්මි නානායක්කාර මිය	:-කැඳවුම් කරු (අභ්‍යන්තර විගණක ජනවසම)

ප්‍රධාන යොමුවීම

මණ්ඩලයේ සම්පත්(රාජ්‍ය දේපල) සැකසුරුවම් ලෙස හා කාර්යක්ෂමව භාවිතාකර ඇති බවට සහතික වීම හා ව්‍යාපෘති වැඩ සටහන් සැලසුම් වලට අනුව ක්‍රියාත්මක වන බවට තහවුරු කර ගැනීම අභ්‍යන්තර විගණකගේ හා බාහිර විගණකාධිපති වාර්තාවල ප්‍රදාන ගැටලු හඳුනාගෙන නිවැරදි කර මග පෙන්වමින් මූල්‍ය හා වක්කම් කළමණාකරණය ඉහළනන්වාලීම.

පවත්වන ලද විගණන කමිටු රැස්වීම්

2016 වර්ෂයේ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 2 ක් පවත්වා ඇති අතර එය පහත පරිදි වේ.

නම	2016 ජූලි 13	2016 ඔක්තෝම්බර් 06
එස්.එම්.දයාරත්න මහතා	v	v
නිලූ දිල්හාරා විජේදාස මහතා	v	v
ගාල්ලෙ ආරච්චි මහතා	v	v

මීට අමතරව වෙනත් කමිටුවල් සඳහා වැඩ බලන සාමාන්‍යාධිකාරී හා අනෙකුත් කළමණාකරුවන්ද කමිටු පරිශීලකයාව පවිදි කැඳවන ලදී.

විගණන හා කළමණාකරන කමිටු විගණකාධිපති කාර්යාලයේ වැවිලි අංශයේ රජයේ විගණන අධිකාරී සමඟ ආයතනික තිරන ගැනීම් වලදී සෘජු සම්බන්ධතා පවත්වාගෙන යමින් කටයුතු කරයි.

විගණන හා කළමණාකරන කමිටුරැස්වීම් වලදී පහත සඳහන් කරුණු සාකච්ඡා කරන ලදී.

1. රජයේ විගණන අංශය මගින් යොමු කර ඇති විගණන විමසුම් රාශියක් සඳහා මණ්ඩලයේ පිළිතුරුලැබී නොමැති බව.
2. අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සකස් කිරීම හා කාර්ය මණ්ඩලය සඳහා රාජකාරි ලැයිස්තු (duty list) බෙදා දැක්වීම කළ යුතු බව.
3. 2015 වසරේ අවසන් ගිණුම්සකස් කොට එය රජයේ විගණන අංශය වෙත කඩිනම්න් ලබාදිය යුතුය.
4. ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතු බව
5. සැලකිය යුතු ඇස්තමේන්තු හා තින්දු
6. ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාර සකස් කර ඉදිරිපත් කළ යුතු බව
7. ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම
8. අභ්‍යන්තර විගණක සැලැස්ම ප්‍රකාරව වතු යායන්හි විගණන කටයුතු සිදුකිරීම.
9. 2011 වර්ෂයෙන් පසු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
10. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ය සහ අනෙකුත් අදාල අනුමැතීන් ඇතිවවතුයායන්හි ගස් කැපීම.

<u>අභ්‍යන්තර විගණනය</u>

විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යක්ෂමතාව විමර්ෂණය කළ යුතු අතර, එහි ප්‍රගීපල සොයා බැලිය යුතු අතර,ඉහළ කළමණාකරනය වෙත නිර්දේශ ලබාදිය යුතුය. මෙම වසරේදී විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් දෙකක් පැවැත්වූ අතර ,එවැනි විවිධ ක්ෂේත්‍රයන් වල පවතින අවධානම් තොරා ගැනීම සම්බන්ධව අභ්‍යන්තර විගණන වාර්තාවල අනාවරණයක් සිදුවී ඇත්ද යන්න විමර්ශණය කරන ලදී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පිටපත්/ඒ/ජේවීසීබී/01/16 මගෙ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජූනි /2 දින

සභාපති

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපතිවරයා වෙත 2018 ජනවාරි 12 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

උක්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 10 oagpgov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.4 මතය ව්‍යාවර්තය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවර්තය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයට අයත් වතු 23 ක් අඛණ්ඩව අලාභ ලැබීම මත හා ගෙවිය යුතු ව්‍යවස්ථාපිත වගකීම් ප්‍රමාණය අධික වීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් සහ කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.340,140,366 ක සහ රු.1,845,703,984 ක සෘණ අගයක් ගෙන තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශුද්ධ වත්කම්වල පිරිහීම සියයට 37 ක් හා කාරක ප්‍රාග්ධනයේ පිරිහීම සියයට 5 ක් වූ අතර මෙවැනි තත්ත්වයක් මත තව දුරටත් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව මණ්ඩලය පවත්වාගෙන යෑමේ අවිනිශ්චිත තත්ත්වයක් පවතිනා බව නිරීක්ෂණය විය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

පාරිභෝගික අංශයේ රු.13,002,883 ක් වූ ණයගැති ශේෂයෙන් අඩමාන ණය ලෙස රු.857,604 ක වෙන්කිරීම් සිදුකර තිබුණද එය සටහන් මගින් හෙළිදරව් කිරීමකින් තොරව ශුද්ධ අගය වූ රු.12,145,279 ක් පමණක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

(i). සමාලෝචිත වර්ෂයේ මුදලින් තොගෙවූ රු.196,480 ක් වූ ව්‍යස්ථාපිත ගෙවීම් වලට අදාළ අධිභාර වියදම ප්‍රමිතයේ 20 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන අයිතමයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර අලාභයට ගැලපීම් කර නොතිබුණි.

(ii). සමාලෝචිත වර්ෂයට අදාළව මුදලින් ලැබී තිබූ පොලී ආදායම් රු.71,130 ක් බදු පෙර අලාභයෙන් අඩුකර ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු වුවද බදු පෙර අලාභයට එකතුකර දක්වා තිබුණි.

(iii). රජයේ වාණිජ බැංකුවකින් ලබාගෙන තිබූ බැංකු ණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.16,443,117 ක ණය පියවීම් කර තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ එය රු.15,150,616 ක මුදල් ගලායෑමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ගලායෑම් රු.1,292,501 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv). මූල්‍ය ප්‍රකාශන අනුව, පාරිතෝෂික වෙන් කිරීම් හා මුදලින් ගෙවා තිබූ පාරිතෝෂික වාරිනාකම පිළිවෙලින් රු.44,685,417 ක් හා රු.9,383,451 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පිළිවෙලින් රු.40,639,179 ක් හා රු.8,425,958 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.3,088,745 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(v). මූල්‍ය ප්‍රකාශන අනුව, පැමිණීමේ සේවක ප්‍රසාද දීමනා වෙන්කිරීම් හා මුදලින් ගෙවන ලද දීමනාව පිළිවෙලින් රු.3,277,158 ක් හා රු.3,106,081 ක් වුවද එය මුදල් ප්‍රකාශනයේ පිළිවෙලින් රු.2,372,806 හා රු.2,979,183 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.435,300 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(vi). සමාලෝචිත වර්ෂයට අදාළ රු.32,290,549 ක් වූ ක්ෂය හා ක්‍රමක්ෂය වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.32,732,929 ක් ලෙස ගැලපීම් හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.442,380 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(vii). සමාලෝචිත වර්ෂය තුල පරිනත නොවූ ජීව විද්‍යාත්මක වත්කම්වලින් පරිනත ජීව විද්‍යාත්මක වත්කම් වලට මාරු කර තිබූ රු.18,218,710 ක මූල්‍ය නොවන වියදම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය තුල ක්ෂේත්‍ර සංවර්ධන වියදම් යටතේ මුදල් ගලා යෑමක් ලෙස දක්වා තිබුණි.

(viii). සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ සඳහා දරන ලද වියදම රු.2,125.980 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී එය රු.20,805107 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.18.679.127 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv). වැඩි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.2,127,249 ක සහනාධාර වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.2,400,224 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන කටයුතු වලින් මුදල් ගලා ඒම රු.272,975 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i). පිරිවැය රු.17,925,625 ක පරිනත වගාවන් (Mature Planation Vested) වෙනුවෙන් 2011 වර්ෂයේ සිට නියමිත වටිනාකම ඉක්මවා ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.594,554 ක ක්‍රමක්ෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ii). ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව වත්කමක් ක්ෂය කිරීම එය පාවිච්චි කිරීම සඳහා සුදානම් තත්ත්වයට ගෙන ආපසු ආරම්භකළ යුතු වුවත්, මණ්ඩලය ස්ථාපිත කරන අවස්ථාවේ පැවති පිරිවැය රු.8,699,304 ක් වූ වෙනත් වත්කම් (Other Vested Assets) වලට අදාළව 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ක්ෂය ප්‍රතිපාදන සිදුකර නොතිබූ අතර ප්‍රත්‍යාගණනය කිරීමද සිදුකර නොතිබුණි.

(iii). අංක 320 ඩාලි පාර යන ලිපිනයේ පිහිටි මණ්ඩලයට අයත් ගබඩා හා කාර්යාල ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල රු.129,630 ක් ලෙස දක්වා තිබූ නමුත් ඒවා ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 32

ප්‍රමිතයේ ඡේද අංක 15 ප්‍රකාරව මූල්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව විස්තරය තුළ වෙනම ශීර්ෂයන් යටතේ දැක්විය යුතු වුවත් එකතුව රු. 3,651,833 ක් වූ මූල්‍ය වත්කම්, ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

ප්‍රමිතයේ ඡේද අංක 09 ප්‍රකාරව, මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට ගැලපීම් කළ යුතු වුවත් මණ්ඩලය විසින් අදාළ ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41

(i) වාණිජ වටිනාකමක් සහිත ශාකවල වටිනාකම් ලබා ගැනීම සඳහා ආයුගණක තක්සේරුවක් (Actuarial Valuation) සිදු නොකිරීම හේතුවෙන් පාරිභෝජ්‍ය ජීව වත්කම් (Consumable Biological Asset) වටිනාකම් ගිණුම් මගින් හඳුනාගෙන නොතිබුණි.

(ii) වටිනාකම් රු.21,041,223 ක් වූ පරිනත නොවූ දැව වගාවන් සඳහා දරන ලද පිරිවැය. පරිනත නොවූ පාරිභෝජ්‍ය ජීව වත්කම් යටතේ වාර්තා කිරීම වෙනුවට අතුරු භෝග වගාවන් යටතේ ප්‍රාග්ධනීකෘත කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අතුරු භෝග වගාවන් සඳහා පරිනත නොවූ වගාවේ සිට පරිනත වගාව වෙත මාරු කරනු ලබන කාලය නිශ්චිතව ගිණුම් ප්‍රතිපත්ති මඟින් හෙළිදරව් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම වගාවන්ට අදාලව ප්‍රාග්ධනීකෘත කරන ලද රු.19,881,889 ක්වූ වියදම් පරිනත වගාවන් යටතේ වාර්තා කළ නොහැකි වී තිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දින දක්වා පරිනත වගාවන්ට අදාළව රු.82,143,685 ක ක්ෂය අඩුවෙන්ද සමාලෝචිත වර්ෂයේදී රු.4,119,729 ක ක්ෂය වැඩියෙන්ද ගණනය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවතිය යුතු සමුච්චිත ක්ෂය වටිනාකම රු.78,023,956 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පරිනත නොවූ වගාවන් සඳහා රු.319,649 ක වියදමක් දරා තිබූ අතර එම පිරිවැය පරිනත නොවූ වගාවන්ට අදාළව ප්‍රාග්ධනීකෘත කිරීම වෙනුවට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

(ඇ) කෙටිකාලීන භෝගයන් වන ඉඟුරු හා කොසෙල් වගාවන් වෙනුවෙන් 2002 හා 2011 වර්ෂවලදී දරා තිබූ රු.225,955 ක් පරිනත නොවූ වගාවන් යටතේ ප්‍රාග්ධනීකෘත කර තිබුණද එම පිරිවැය ගිණුම් මඟින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී එකතු කරන ලද කෙරිගෙන යන වැඩ වටිනාකම රු.1,169,657 ක් හා වර්ෂයේ ප්‍රාග්ධනීකෘත කල වටිනාකම රු.8,456,124 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹුවෙන් රු.28,504,581 ක් හා රු.21,974,671 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) මණ්ඩලයේ වකු මඟින් වන වගාව වෙනුවෙන් හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද එකතුව රු.2,339,481 ක් වූ වියදම් අදාළ ගිණුම් යටතේ වෙන වෙනම ප්‍රාග්ධනීකෘත කිරීම වෙනුවට කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ඊ) තේ සහ රබර් අවසන් තොග වටිනාකම් ගණනය කිරීමේදී තොග සම්ක්ෂණයක් සිදුකර අවසන් තොගය ගිණුම්ගත කිරීම වෙනුවට ශුද්ධ පොත් අගය වූ රු.78,915,712 ක් ගිණුම්ගත කර තිබුණි. තවද එම ශේෂය ගණනය කිරීමේදී 1999 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පැවති රු.3,568,335 ක හා රු.1,014,417 ක සෘණ ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීම වෙනුවට අවසාන තොග ශේෂයට බිලව් කර දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී රහතුන්ගොඩ වතුයාය මගින් දරන ලද රු.234,859 ක් වූ වාහන අලුත්වැඩියා වියදම්, දැව වගාව සඳහා දරන ලද වියදමක් ලෙස ප්‍රාග්ධනීත කර තිබුණි.

(ඌ) මණ්ඩලයේ වතුයායන්හි හා ප්‍රධාන කාර්යාලයේ මුළු පිරිවැය රු.12,829,343 ක් වූ යන්ත්‍ර සූත්‍ර, වාහන, උපකරණ, පරිගණක හා ගෘහ උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයට අදාල රු.2,567,521 ක් වූ ක්ෂය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් එම වත්කම් වල ශුද්ධ අගය වැඩියෙන් හා මෙහෙයුම් ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(එ) මණ්ඩලයේ වතුයායන්හි හා ප්‍රධාන කාර්යාලයේ මුළු පිරිවැය රු.13,756,219 ක් වූ පාරවල් හා පාලම්, යන්ත්‍ර සූත්‍ර, උපකරණ යන වත්කම් සඳහා ඉකුත් වර්ෂයන්ට අදාල ක්ෂය රු. 963,119 ක් සමාලෝචිත වර්ෂයට අදාලව ගැලපීම් කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) මණ්ඩලයේ වතුයායන්හි හා ප්‍රධාන කාර්යාලයේ මුළු පිරිවැය රු.4,098,997 ක් වූ පරිගණක හා උපකරණ සඳහා මණ්ඩලය විසින් අනුගමනය කරන ක්ෂය අනුපාතය ඉක්මවා ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල රු.636,873 ක ක්ෂය වැඩියෙන් ගිණුම් ගතකර තිබූ අතර මෙහෙයුම් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා වත්කම්වල ශුද්ධ අගය අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) මණ්ඩලයට අයත් කොළඹ පිහිටි ගොඩනැගිලි 12 ක් බදු දීම මගින් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ආදායම රු.43,789,256 ක් වුවද එය රු.10,041,700 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයට අදාල ආදායම හා ලැබිය යුතු ආදායම රු.33,747,556 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් බදු කුලී ආදායම රු.44,541,880 ක් ලෙස දක්වා තිබුණද, එම ආදායම තුළ පෙර වර්ෂවලට අදාළව ගෙවන ලද රු.15,854,592 ක් හා ගොඩනැගිලි කුලී ආදායම් රු.16,978,168 ක් විය. තවද සමාලෝචිත වර්ෂයේදී බදු ආදායම ගණනය කිරීම සඳහා යොදාගනු ලැබූ ඉඩම් 20 ක් සඳහා රු.459,372 ක බදු කුලී ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව උපකරණ වාර්ෂිකව සියයට 12.5 ක් ක්ෂය කල යුතු වුවත්, එම වත්කම් සියයට 5 ක අනුපාතයක් යටතේ ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.61,438 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඛ) සියලුම පරිනත වගාවන් සඳහා සියයට 5 ක ප්‍රතිශතයකින් ක්‍රමක්ෂය ප්‍රතිපාදන සිදුකල යුතු වුවත්, රු.8,203,624 ක් වූ අනෙකුත් පරිනත වගාවන් සඳහා ක්‍රමක්ෂය ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ග) 1997 වර්ෂයේ සහ ඊට පසු වර්ෂයන්ගේ සිට ස්ථාපිත කරන ලද පාරවල් සහ පාලම්, ලැයිම් කාමර හා ගොඩනැගිලි සඳහා වාර්ෂිකව සියයට 5ක් ක්ෂය කළ යුතු වුවත් වර්ෂ ගණනාවක සිට සියලුම වත්කම් ඇතුළත් වූ පරිදි ක්ෂය ගණනය කර නොතිබුණි. ඒ අනුව පිරිවැය

රු.40,017.533 ක් වූ එම වත්කම් වලට අදාලව 2015 දෙසැම්බර් 31 දක්වා වූ රු.21,248,940 ක ක්ෂය හා සමාලෝචිත වර්ෂයට අදාළ රු.2.000.877 ක් වූ ක්ෂය සම්පූර්ණයෙන්ම ගිණුම්ගත කර නොතිබුණි.

(ඝ) 2012 වර්ෂයෙන් පසු මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර සඳහා සියයට 20 ක අනුපාතයක් යටතේ හා ඊට පෙර වර්ෂයන්ට අදාළව මිලදී ගත් යන්ත්‍ර සඳහා සියයට 33 1/3 අනුපාතයක් යටතේ ක්ෂය කිරීම මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තිය වූවත් වතු 04 ක් විසින් මෙම ගිණුම් ප්‍රතිපත්තිය අනුගමනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ක්ෂය රු.1,030,073 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඞ) 2009 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් දරා තිබූ රු.6,051,265 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘති අසාර්ථක වී තිබූ නමුත් එම වියදම් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඟ) පරිනත තත්ත්වය යටතේ ගිණුම් ගතකල යුතු රු.177,961 ක් වටිනා පැල තවාන් වෙනුවෙන් දරන ලද වියදම් සමාලෝචිත වර්ෂය වන විටත් කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ච) වසර 05 කට අධික කාලයක සිට කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ ශේෂය තුල දක්වා තිබූ රු.3,339,466 ක් වූ අයහාර ස්වභාවයේ වියදම් වියදම් ලෙස කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඡ) 2016 වර්ෂයට අදාළ රු.231,859 ක් වූ ස්ථාවර තැන්පතු පොළී ආදායම් ගිණුම්වලින් අත්හැරි තිබුණි.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙජර් ගිණුම් ශේෂය රු.21,974,761 ක් වුවද, උපලේඛණ අනුව එය රු.21,218,114 ක් වූයෙන් රු.756,647 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිනත නොවූ තේ, රබර් හා වෙනත් වගාවන්ට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් හා උපලේඛන අතර පිළිවෙලින් රු.75,508,295 ක හා රු. 88,120,005 ක වෙනසක් නිරූපනය විය.

(ඇ) ස්ථාවර තැන්පතු වලට අදාළ ලෙජර් ගිණුම් අනුව ශේෂය රු.3,651,833 ක් වූ අතර ස්ථාවර තැන්පතු ලේඛණය අනුව එම වටිනාකම් රු.3.582,416 ක් වූයෙන් රු.69,417 ක වෙනසක් පැවතුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව, පරිත්‍යෝජිත වෙන්කිරීම ඇස්සය, ගෙවිය යුතු පාරිතෝෂික හා පාරිතෝෂික පරිහාර වියදම් යන ශේෂ සහ අදාළ උපලේඛණයන් අතර එකතුව රු.34,993,072 ක වෙනසක් පැවතුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශන අනුව ඇල්කඩුව වැවිලි සමාගමෙන් ලැබිය යුතු වටිනාකම රු.670,350 ක් වුවද, එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.1,185,670 ක් විය.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

	විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.	
(අ)	ඉඩම්, ගොඩනැගිලි හා වාහන	1,651,989,274	i. උපලේඛන ii. ස්ථාවර වත්කම් ලේඛනය iii. භෞතික සත්‍යාපන වාර්තා
(ආ)	පාරිභෝගික අංශයේ ණයගැති ලැබීම් හා ගලහ චතුයාගේ ණයගැති ලැබීම්	28,986,415	i. උපලේඛන ii. ණයගැති කාල විශ්ලේෂණ iii. ශේෂ සනාථන
(ඇ)	ගෙවිය යුතු වෙළඳ ගිණුම්	2,532,160,239	i. උපලේඛන ii. ණයහිමි කාල විශ්ලේෂණ
(ඈ)	කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ	3,197,506	ව්‍යාපෘති ලිපිගොනු
(ඉ)	ස්ථාවර තැන්පතු	3,651,833	ස්ථාවර තැන්පතු පහතික හා බැංකු ශේෂ සනාථන

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 05 කට අධික කාලයක සිට අක්‍රියව පවතින වටිනාකම රු.339,549,051 ක් වූ ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(හා) 2009 වර්ෂයේ සිට පැවත එන නිරවුල් නොකරනා ලද උත්සව අත්තිකාරම් රු.654,077 ක් අදාල සේවකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට නිරවුල් නොකරනා ලද රු.17,352,768 ක උපචිත වියදම් හා රු.48,338,488 ක් වූ නැවත ගෙවිය යුතු තැන්පතු පැවති අතර මෙම වගකීම් නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක සිට වතු සේවක කම්කරුවන්ගේ වැටුපෙන් අඩුකර තිබූ රු.7,789,052 ක් වූ කම්කරු සම්පත් සඳහා සාමාජික ගාස්තු අදාළ සමිති වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ලැබිය යුතු බදු කුලී ආදායම් තුළ නිශ්චිතව හඳුනානොගත් රු.16,619,043 ක හර ශේෂ හා රු.2,274,185 ක බැර ශේෂ පැවති අතර එම ශේෂ හඳුනාගෙන අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත	මණ්ඩලයේ ව්‍යවස්ථාපිත වගකීම් නිසි පරිදි නිරවුල් නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලට රු.381,475,552 ක් ද, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට රු.32,367,337 ක්ද, වතු සේවකයින්ගේ අර්ථසාධක අරමුදලට රු.19,139,467 ක් ද, ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදලට රු.3,200,018 ක් ද, ගෙවිය යුතු පාරිතෝෂික රු.512,688,406 ක් හා නඩු තීරණ මත ගෙවිය යුතු සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් රු.502,339,067 ක් ද ඇතුලුව එකතුව රු.1,451,209,847ක ව්‍යවස්ථාපිත වගකීමක් පැවතුණි.
(ආ) 2015 මැයි 25 දිනැති අංක පිරිඩි 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරීන් මාසිකව රු.30,000 බැගින් ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවා තිබූ අතර මේ සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.1,791,120 ක වියදම් දරා තිබුණි.

(ඌ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

පත්තිකාරම් කාර්යය නිමි දින 10 ක් තුළ අදාළ අත්තිකාරම් ප්‍රයෝජය ලබූ වුවත් වර්ෂය ඉක්ම වූ රු.20,911,975 ක අත්තිකාරම් පැවතුණි.

(ඇ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත

සෑම කාර්තුවක් අවසන් වී ඊළඟ මාසයේ 20 දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ආර්ථික සේවා ගාස්තු ගෙවීම් කළ යුතු වුවද, වර්ෂ ගණනාවක සිට එසේ ගෙවීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගාස්තුව රු. 7,819,534 ක් විය.

(ඉ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනත

බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගත් ජාතිය ගොඩනැඟීමේ බදු රු. 8,549,879 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු නොකර මණ්ඩලයෙහි රඳවාගෙන තිබුණි.

(ඊ) 1995 ජූලි 21 දිනැති රජයේ ඉඩම් පැවරීම් පිළිබඳ නිකුත් කළ මාර්ගෝපදේශ සංග්‍රහය

මාර්ගෝපදේශ අංක 08 අනුව රජයේ ඉඩම් බදු දීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබාගන්නා තක්සේරු වාර්තාවක් මත පදනම් ව බදු මුදල් අයකළ යුතු වුවත් එයට පටහැනිව පෞද්ගලික ආයතනයක් වෙත අවබෝධතා ගිවිසුමක් මගින් වසර 25 ක කාලයකට වර්ග අඩි 4825 ක් ද තවත් ආයතනයකට වර්ග අඩි 5322 ක්ද 2003 අප්‍රේල් 01 දින සිට වසර 30 ක කාලයක් සඳහා ද බදු දී තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.563,961,014 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.443,532,303 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.120,428,711 ක පිරිහීමක් විය. සමාලෝචිත වර්ෂයේ නිමි කේ නිෂ්පාදනය පහළ යෑම, හේතුවෙන් දළ ලාභය රු.28,228,298 කින් අඩුවීම. ගොඩනැඟිලි හා බදු කුළී ආදායම රු.95,819,181 කින් අඩු වීම හා වෙනත් ආදායම් රු.48,226,325 කින් පහළ යෑම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමෙදී 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අලාභයක් දැනි වී තිබුණි. 2013 වර්ෂයේ රු.676,285,352 ක ඉහළම

ලාභය පෙන්නුම් කල අතර 2014 වර්ෂයේදී එය රු.413,342,669 ක් දක්වා අඩු වී තිබුණි. නැවතත් 2015 වර්ෂයේ සිට ලාභය ක්‍රමයෙන් වැඩිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂයවීම් නැවත ඇලපිමේදී 2012 වර්ෂයේදී රු.177,128,495 ක සෘණ දායකත්වයක් ඇති වී තිබුණද 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ධන දායකත්වයක් සහිතව රු.666,532,742 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී එම දායකත්වය නැවතත් රු.265,931,450 ක් දක්වා අඩු වී තිබුණි.

විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තැරවිකරුවන් වෙත ගෙවනු ලබන පොළී ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 46 කින් අඩු වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වියදම් සියයට 21 කින් අඩු වී තිබුණි.

(ආ) මණ්ඩලයේ ප්‍රධාන නිෂ්පාදන අයිතමයන්ගේ ලාභදායීත්වය සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක සමග සසඳා පහත දැක්වේ.

	මුළු දායකත්වය		
නිෂ්පාදිතය	2016	2015	2014
	රු.	රු.	රු.
තේ	(374,060,186)	(416,531,996)	(309,250,507)
රබර්	(23,958,649)	(18,419,436)	(19,453,637)
පොල්	(4,958,669)	(4,467,633)	(3,315,237)
අතුරු භෝග	910,931	9,483,167	6,332,600
ජන ටී	3,200,522	2,841,547	2,401,614

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂයේ නිමි තේ හා අමු තේ දළු අලෙවියෙන් වූ ලාභය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 21 කින් ඉහළ ගොස් තිබූ අතර, 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 10 කින් අඩුවී තිබුණි.

(ii). සමාලෝචිත වර්ෂයේ රබර් කිරි නිෂ්පාදනය පෙර වර්ෂයට සාපේක්ෂව කිලෝ ග්‍රෑම් 84,267 කින් ඉහළ ගොස් තිබුණද, නිෂ්පාදන පිරිවැය සියයට 14 කින් ඉහළ ගොස් තිබූ බැවින් 2015 වර්ෂයට සාපෙක්ෂව ලාභය සියයට 30 කින් ඉහළගොස් තිබුණි.

(iii). සමාලෝචිත වර්ෂයේ අලෙවිකරන ලද පොල් ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව ගෙඩි 26,769 කින් වැඩි වී තිබූ අතර ආදායම සියයට 57 කින් ඉහළ ගොස් තිබුණි. නිෂ්පාදන පිරිවැය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 17 කින් ඉහළ යෑම හේතුවෙන් පොල් නිෂ්පාදනයේ දායකත්වය කව දුරටත් අඩු වී තිබුණි.

(iv.) කුමාරවත්ත වතුයායේ උක් වගා ව්‍යාපෘතිය මගින් පෙර වර්ෂයේ ලැබී තිබූ රු.3,179,517 ක් වූ ආදායම් සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නොලැබීම සමාලෝචිත වර්ෂයේ අතුරු භෝග වගාව මත වූ දායකය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් අනුපාත කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

විස්තර	2016	2015	2014
දළ ලාභ අනුපාතය	-80%	-73%	-49%
ශුද්ධ ලාභ අනුපාතය	-114%	-76%	-26%
ජංගම අනුපාතය	1:3.7	1:3.8	1:4.3
ක්ෂණික අනුපාතය	1:4.2	1:4.2	1:4

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමාගමේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය සෘණ අගයක් ගෙන තිබූ අතර එය පිළිවෙලින් සියයට 35 සිට සියයට 65 දක්වාද සියයට 76 සිට සියයට 114 දක්වාද තව දුරටත් පිරිහී තිබුණි. තවද මණ්ඩලයේ ද්‍රවශීලතා අනුපාතය ඉතා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් කාරක ප්‍රාග්ධන ගැටළු ඇතිවීමේ අවදානමක්ද පැවතිණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ හා කර්මාන්තශාලා පිහිටුවීම හා නඩත්තුව පවත්වාගෙන යාම මණ්ඩලයේ ප්‍රධාන අරමුණක් විය. එසේ සක්‍රිය තත්ත්වයේ පැවති කර්මාන්තශාලා 6ක් බදු දී පැවති අතර, වතුයායන් 5ක් තුළ පිහිටි තේ කර්මාන්තශාලා සමාලෝචිත වර්ෂය අවසන් වන විට අක්‍රිය තත්ත්වයේ පැවති අතර අදාළ කර්මාන්තශාලා තුළ පැවති ඵොක් අගය රු.7,639,107 ක් වටිනා යන්ත්‍ර සූත්‍රද දිරායෑමට ලක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වතු 17 ක නිමි තේ කිලෝවක දායකය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සෘණ අගයක් ගෙන තිබූ අතර එය රු.179 සිට රු.533 දක්වා පරාසයක පැවතුණි. ඒ අනුව මණ්ඩලය විසින් තේ කිලෝග්‍රෑම් එකක් නිපදවීමෙදී දැරීමට සිදුවන මූලික පිරිවැය විකුණුම් ආදායමෙන් ආවරණය කරගත නොහැකි වීමෙන් සෘණ දායකත්වයක් ඇති වී තිබුණි.

(ඇ) තේ පර්යේෂණ ආයතනයේ ප්‍රමිතීන්ට අනුව මැදරට තේ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව කිලෝග්‍රෑම්1200 ක් පමණ වීය. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ හෙක්ටයාරයක නිමි තේ ඵලදාව කිලෝ ග්‍රෑම් 221 ත් කිලෝ ග්‍රෑම් 508 ත් අතර පරාසයක පැවති අතර එය තේ පර්යේෂණ ආයතනයේ ප්‍රමිතීන්ට අනුව සාමාන්‍ය ඵලදාව වන කිලෝ ග්‍රෑම් 1200 සමඟ

සැසඳීමේදී ඉතා පහළ අගයක් ගෙන තිබුණි. එමෙන්ම මණ්ඩලයේ අයත් ග්‍රේවැලි වතුයාය හැර අනෙකුත් වතුයායන්හි හෙක්ටයාරයක නිමි තේ නිෂ්පාදනය පෙර වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) මණ්ඩලය විසින් බදු දී තිබූ දේපල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබූ දේපලක් වෙනුවෙන් එම සමාගම විසින් බදු ගිවිසුම් ප්‍රකාරව බදු කුලී නොගෙවීම් හේතුවෙන් මණ්ඩලය විසින් එම සමාගමට එරෙහිව අංක එස්/71049/2010 දරන නඩුව ගොනුකර තිබූ අතර 2011 පෙබරවාරි 02 දිනැති අධිකරණ නියෝගය අනුව බදුකරු අදාල දේපලෙන් නෙරපා හැරීමට තීන්දු කර තිබුණි. බදුකරු විසින් ඉදිරිපත් කර තිබූ ආර්ඒ 39/2011අභියාචනා අයදුම් පතද ඉවත දැමීම හේතුවෙන්, අදාළ පරිශ්‍රය 2014 ඔක්තෝබර් 02 දින සිට දින 7 ක් ඇතුළත ජනවසම නිළධාරීන්ට භාරදීමට කටයුතු කරන ලෙස සාමාන්‍යාධිකාරී (වැඩ බලන) විසින් බදුකරු වෙත දන්වා තිබුණි. එහෙත් බදුකරු විසින් අදාළ දේපල මෙම වාර්තාවේ දින වන විටත් මණ්ඩලය වෙත බාර දී නොතිබුණ අතර ඒ සම්බන්ධයෙන් කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ii) මණ්ඩලය විසින් පුද්ගලික සමාගමක් වෙත වර්ග අඩි 23,989 ක් 2013 ජනවාරි 01 සිට 2014 දෙසැම්බර් 31 දක්වා වර්ෂ දෙකක් සඳහා බදු දී තිබූ අතර අදාළ බදු කාලය අවසන් වුවද, නව බදු ගිවිසුමකට එළඹීමකින් හෝ බදු මුදල් ගෙවීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් බදුකරු ගොඩනැගිලි භුක්ති විඳිමින් පැවතුණි.

(iii) 2012 අගෝස්තු 04 සිට වසර 4 ක කාලයක් සඳහා වර්ග අඩියක් රු. 60 බැගින් වර්ග අඩි 11500 ක ගොඩනැගිල්ලක් ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය වෙත බදු දී තිබූ අතර 2016 අගෝස්තු 03 දින අදාළ බදුකාලය අවසන් වී තිබුණි. මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් නව බදු කුලී ලෙස මාසිකව රු.1,437,500 ක් බැගින් අයකරන ලෙස තාක්ෂණික ආයතනය වෙත 2016 සැප්තැම්බර් 03 දින ලිපියක් මගින් දන්වා තිබූ නමුත් තාක්ෂණික ආයතනය ඒ සඳහා එකඟතාවය පලකර නොතිබූ අතර පැරණි බදු මුදලම් ගෙවමින් පැවතුණි. ඒ අනුව බදු කාලය අවසන් වී තිබුණද නව බදු ගිවිසුමකට එළඹීමට හෝ විධිමත් තක්සේරුවක් සිදුකර වෙනත් බදුකරුවකු වෙත එම ගොඩනැගිල්ල බදු දීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

(iv) වසර 25 ක කාලයක් සඳහා අංක 320, ඩාලිපාර පිහිටි වර්ග අඩි 14500 ක ගොඩනැගිල්ලක් 2003 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමක් වෙත වර්ග අඩියක් රු.13.50 බැගින් බදු පදනම් මත ලබා දී තිබූ අතර 2005 ඔක්තෝබර් 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ 3 (ඒ) ඡේදයට අනුව සෑම වසර 5 කට වරක්ම රජයේ තක්සේරුවකට අනුව, මාසික බදු මුදල් අප කල යුතු වුවත් මණ්ඩලය විසින් අදාල බදු මුදල්

රයයේ නක්සේරුව අනුව අයකර නොතිබූ අතර බදු කරු විසින් පැරණි බදු මුදලම සමාලෝචිත වර්ෂය අවසන් වන විටක් ගෙවීමක් පැවතුණි.

(v) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, වැවිලි කර්මාන්ත අධීක්ෂණ අංශය, නුරුසවිය අරමුදල හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යන ආයතන වෙත බදු පදනම් මත ලබාදී තිබූ ජනවසම ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි වෙනුවෙන් අය වීමට තිබූ හිඟ බදු මුදල රු.14,248,699 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ බදු මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. එම ආයතන ඉවත්ව යාමෙන් පසුව මෙම ගොඩනැගිලි බදු පදනම් මත ලබාදීම සඳහා කටයුතු කර නොතිබීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට මෙම ගොඩනැගිලි නිශ්කාර්යව පැවති අතර එම ආයතන වලින් අවසන් වරට අය කල මිල ගණන් අනුව වර්ග අඩි 33567 ක් බදුදීම මගින් වර්ෂයකට ලබා ගතහැකිව තිබූ රු.22,515,000 කට ආසන්න ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි.

(vi) ඇල්කඩුව වැවිලි සමාගම වෙත බදු පදනම් මත ලබාදී තිබූ අංක 520, ඩාර්ලි පාරේ පිනිරි ගොඩනැගිල්ලේ පළමු මහලේ වර්ග අඩි 2572 ක් සඳහා 2015 දෙසැම්බර් 31 දින දක්වා වර්ග අඩියක් රු.60 බැගින් බදු කුලී අය කර ගැනීම සඳහා මණ්ඩලය මගින් ඉන්වොයිස් නිකුත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කිසිදු බදු මුදලක් ගෙවා නොතිබූ අතර, දෙපාර්ශවය විසින් බදු ගිවිසුමකටද එළඹ නොතිබුණි.

(ආ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාවේ දත්තයන්ට අනුව හෙක්ටයාරයකට රබර් පැළ 550 ක් පැවතිය යුතු වුවත් කුමාරවත්ත වතුයායේ එම අගය 200-500 අතර පරාසයක පැවතුණි.

(ඇ) මණ්ඩලය විසින් විගණනය වෙත ඉදිරිපත්කල උප ලේඛණය අනුව බදු දී තිබූ ඉඩම් ප්‍රමාණය අක්කර 2688 ක් වූ අතර ඉන් අක්කර 313.9 කට අදාළ බදුකුලී ආදායම පමණක් මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අතර ඉතිරි ඉඩම් ප්‍රමාණයට අදාළව බදුකුලී ආදායම් ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමගාමී රජයේ වැවිලි සමාගමක් වන ඇල්කඩුව වැවිලි සමාගම වෙත 2016 ඔක්තෝබර් වන විට රු.7.328.456 ක මුදලක් පෞද්ගලික සමාගමක් විසින් තේ දළු සැපයීම වෙනුවෙන් ගෙවිය යුතුව පැවතියදී, මණ්ඩලය විසින් එම පෞද්ගලික සමාගම වෙත හන්තාන වතුයායේ තේ දළු සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 27 දින ගිවිසුමකට එළඹ තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඇල්කඩුව වැවිලි සමාගමේ සභාපතිවරයා වී සිටියදී ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල මණ්ඩලයේ තේ දළු සැපයීම වෙනුවෙන් එම පෞද්ගලික සමාගම විසින් ගෙවිය යුතු රු.5,865,670 ක මුදල 2017 වර්ෂය අවසන් වන විටක් අය වී නොතිබුණි.

(සා) 2015 වර්ෂයේ සක්‍රියව ක්‍රියාත්මක වූ තත්ත්‍යාත්ත තේ කර්මාන්ත ශාලාව 2016 වර්ෂයේ කාර්යයාලීය අවධානයක් පැවතීම හේතුවෙන් වැඩ නවතා දමා තිබුණි. එය තහවුරු කර ගැනීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර එම කර්මාන්ත ශාලාව බාහිර පාර්ශවයකට බදු පදනම මත ලබාදී තිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 13 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්කිරීමක් කල යුත්තේ නිත්‍ය තනතුරක පවතින ප්‍රුරප්පාඩුවක් සඳහා වන අතර පත්කිරීමේ බලධාරියා විසින් පත්කර ඇත්තේ නම අතිරේක පාරිශ්‍රමික නොගෙවිය යුතුය. එහෙත් 2015 නොවැම්බර් 23 දින සිට සහකාර වතු අධිකාරිවරයකු, මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරක් වූ කළමණාකරු(වන සම්පත්) තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර ඒ වෙනුවෙන් අදාල නිළධාරියාට අතිරේක සේවක දීමනා දෙකක් ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.500,153 ක වියදමක් දරා තිබුණි.

(ආ) 2013 නොවැම්බර් 18 දිනැති අංක ඩීඑම්එස්/1696 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ මණ්ඩලයේ කළමණාකරු (නීති) MM 1-1 වැටුප් තලයේ සුදුසු පියවරක පිහිටුවිය යුතු බව දන්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ බඳවාගෙන තිබූ නීති නිලධාරීන් දෙදෙනෙකු වෙත ඊට පටහැනිව රු.100,000 ක මාසික දීමනාවක් සහ ඊට අමතරව ප්‍රවාහන සහ ඉන්ධන දීමනා ලෙස රු.30,000 ක් ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,350,000 ක් වැය කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාව විසින් 2016 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2017 නොවැම්බර් 22 දින දීය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

පද්ධති හා පැරණි ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	(i). ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව ගිණුම් සිදුකෙල නොකරන ලද අවස්ථා පැවතීම. (ii). ගනුදෙනු නිසි පරිදි හඳුනාගෙන නිවැරදි ලෙස ලෙජර් ගිණුම්වල ඇතුලත් නොකිරීම. (iii). විගණන වාර්තා මඟින් පෙන්වාදෙන ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට අවධානය යොමු නොකිරීම.
(ආ) බදු දේපල පාලනය	දේපල බදු දීම හා බදු ආදායම් අයකර ගැනීමේ ගැටළු පැවතීම හා බදු දේපළ ආරක්ෂාකර ගැනීමේ අඩුපාඩු පැවතීම. දේපල බදු දීමෙන් ලැබී තිබූ හා ලැබිය යුතු බදු මුදල් ප්‍රමාණය නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ලේඛණ පවත්වාගෙන නොයාම.
(ඇ) මෙහෙයුම් පාලනය	නිෂ්පාදනය වැඩිකර ගැනීමට හා නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම.
(ඈ) ලේඛණ පවත්වාගෙන යාම	පාරිතෝෂික ගෙවීම් ලේඛණ නිසි පරිදි යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ගෙවා අවසන් කල පාරිතෝෂික, ලේඛණයෙන් ඉවත් නොකිරීම සහ එක් සේවකයෙකු වෙනුවෙන්/එක් සේවක අංකයකට වඩා වැඩි ප්‍රමාණයක් නිකුත් කර තිබූ අවස්ථා පැවතීම.

එච්.එම්.ගාමිණි විජේසිංහ
විගණකාධිපති

2016 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1. වාර්තාකරණ ස්ථිතිය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂි කාර්මික සංස්ථා පනත යටතේ 1976 පෙබරවාරි 6 වන දිනැති අංක 199/1M දරණ ගැසට් නිවේදනය මඟින් ස්ථාපනය කරන ලදී. ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලය, අංක 55/75, චොක්ෂ්හෝල් වීදිය, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

1.2. මූලික කටයුතු හා මෙහෙයුම් ස්වභාවය

සලකන මූල්‍ය වර්ෂය තුළ මණ්ඩලයේ මූලික කටයුතු වල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත. මණ්ඩලයේ මූලික කටයුතු වූයේ තේ හා රබර් වගා කිරීම, නිෂ්පාදනය සහ විකිණීමයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් තැරව්කරුවන් හරහා තේ අලෙවි කිරීම වෙනුවට (අගය එකතු කල නිෂ්පාදන) ප්‍රාදේශීය තේ අලෙවිසල්(ජන තේ/ පාරිභෝගික සේවාව) පවත්වා ගෙන යයි.

2. සූදානම් වීමේ පදනම

2.1. ආකූලතා ප්‍රකාශය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ලාභ/අලාභ ප්‍රකාශය හා අනෙකුත් විස්තරාත්මක ආදායම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුදල් ගලා ඒමේ වෙනස්කම් දක්වන ප්‍රකාශය හා ගිණුම් රෙගුලාසි සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා චරලත් ගණකාධිකාරී ආයතනය (CA of Sri Lanka) විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ සම්මතයන්ට (SLFRS සහ LKAS) හා1995 අංක 19 දරණ ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ විගණන සම්මත පනතට අනුව සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය සම්මත කරගත් තීරණයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

2.2. ඇගයුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික වියදම් ගිවිසුම් පදනම් කරගෙන සකස් කර ඇත. අදාළ විශේෂ රෙගුලාසි අනුප්‍රාප්තිය සටහන් මඟින් විස්තර කර ඇත. මූල්‍ය ප්‍රකාශන වල උද්ධමනීය සාධක සඳහා අනුකූලන සිදු කර නොමැති අතර මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඇත.

2.3. ඇස්තමේන්තු සහ විනිශ්චය භාවිතය

ශ්‍රී ලංකා ගණකාධිකරණ සම්මතයන්ට (SLFRSs/ LKASs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී රෙගුලාසි ආදේශනයට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ වාර්තා කිරීමට බලපෑහැකි තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන ගැනීමට කළමනාකරණයක් අවශ්‍ය වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු කරන ලද අගයන්ට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒ සම්බන්ධ උපකල්පන පදනම් වී ඇත්තේ අතීත අත්දැකීම් සහ එම තත්ත්වය යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන වෙනත් විවිධ සාධක මත වන අතර අනෙකුත් ප්‍රභවයන්ගෙන් පහසුවෙන් වෙනස් කළ නොහැකි වත්කම් හා වගකීම් වල වටිනාකම පිළිබඳ තීරණ ගැනීමේ පදනම වන්නේ එහි ප්‍රතිඵලයයි.

ඇස්තමේන්තු සහ උපකල්පන අඛණ්ඩ පදනම්න් සමාලෝචනය කරනු ලැබේ. සංශෝධන, එම මූල්‍ය වර්ෂයට පමණක් බලපෑම් ඇති කරයි නම් එම කාල පරිච්ඡේදයේදී, සංශෝධන එම මූල්‍ය වර්ෂයට සහ අනාගත මූල්‍ය වර්ෂ සඳහා බලපෑම් ඇති කරයි නම් සංශෝධන කාලපරිච්ඡේදය සහ අනාගත කාලපරිච්ඡේද වලදීද ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන භුදුනා ගැනේ.

2.4. ඉදිරි ගමන

ආයතනයේ ඉදිරි ගමන සඳහා මණ්ඩලය පොදු පෞද්ගලික සහ සේවක (PP & E) හවුල්කාරී සංකල්පයක් තුල නැවත ප්‍රතිව්‍යුහගත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. භාවිත නොකළ හෝ අවම වශයෙන් භාවිතා කළ වත්කම් සහ දේපළ පෞද්ගලික ආයෝජකයන් සමඟ කරන හවුල් ව්‍යාපාර සඳහා යෙදවීම අරමුණු කරගෙන වර්තමානයේදී ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ සටහන ආරම්භ කර ඇත. නව ආයෝජන මඟින් අපේක්ෂිත ආදායම් වලින් ජනනය වූ ආදායම් යොදා ගෙන ඕහ EPF සහ ETF පියවීම් සිදු කරයි.ඉදිරි ගමන පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වන තුරු ඔවුන් කිසිදු ව්‍යාපාර කටයුත්තක් අතහැර දැමීම් හෝ නතර කිරීම සිදු නොකරයි.

2.5. සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පෙර වර්ෂයේ භාවිතා කළ ප්‍රතිපත්ති සමඟ නිරන්තරයෙන් ක්‍රියාත්මක කර ඇත. වර්තමාන වසරේ දත්ත නිරූපණය කිරීම සඳහා අදාළ ස්ථාන වලදී මෙම සංඛ්‍යා සහ වාක්‍ය නැවත සකස් කිරීම් සිදු කර ඇත.

2.6. වාර්තා කරන දිනට පසුව සිදුවන සිදුවීම්

මෙයට ඇතුලත් වන්නේ වාර්තාකරණ කාලයෙන් අවසන් වීමෙන් පසුව සිදුවන සිදුවීම් සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය අතර සිදුවන වාසිදායක හා අහිතකර සිදුවීම් වේ.වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවන සිදුවීම්වල ද්‍රව්‍යමයභාවය සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු වෙනස්කම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

3. අනෙකුත් තොරතුරු

3.1. ජ.ව.ස.ම - ගලඛොඩ වතුයාය

ඉහත වතුයාය 1999 වසරේ පෑන් ඒෂියා බැංකු සීමාසහිත සංස්ථාවට උකස් කර ඇති අතර එමඟින් රු. මිලියන 40ක මූල්‍ය පහසුකමක් ලබා ගෙන ඇත. ඉතිරියෙන් කොටසක් කලින් කලට පියවා ඇත. ගෙවිය යුතු පොලිය බැංකුවේ එකඟත්වය මත කපා හැර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2016දෙසැම්බර් 31 වන විට ශේෂ පත්‍රයේ ශේෂය ලෙස රු. 69,536,282.63 ක් පෙන්නුම් විය.

3.2. අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්කම්

2016 මූල්‍ය වර්ෂය තුළදී 2016 දෙසැම්බර් සිට නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කරන ලදී.

4. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් දක්වා ඇති සියලු කාල සඳහා පහත ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශනය කර ඇත.

4.1. ණයට ගැනීමේ පිරිවැය

සාමාන්‍ය සහ විශේෂිත ණයට ගැනීමේ පිරිවැය, අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම ආරෝපණය වන අතර එම වත්කම් විකිණීම සඳහා සූදානම් වන තෙක් එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලැබේ.

ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය ආරම්භවන්නේ එය වත්කම් සඳහා වියදම් දැරුවිට සහ වත්කම් අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමේදී වේ. වත්කම් අපේක්ෂිත භාවිතය සඳහා අවශ්‍ය කටයුතු සැලකිය යුතු තරම් සිදු වූ විට ප්‍රාග්ධනීකරණය නතර කරනු ලැබේ. සුදුසුකම් ලබන වත්කමක ක්‍රියාකාරී සංවර්ධනය අත්හිටුවන්නේ නම් ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය අත්හිටවනු ලැබේ.

මණ්ඩලය විසින් අරමුදල් ලබා ගෙන ඒවා නොමේරූ තේ, රබර් හා කටුපොල් වතුයායන් වැනි වත්කම් සඳහා යොදා ගනියි. ඉහත මෙවැනි වත්කම් සඳහා වන වියදම් සඳහා ප්‍රාග්ධනීකරණ අනුපාතයක් ආදේශ කිරීම මඟින් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණයට ගැනීමේ පිරිවැය මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. මෙම අරමුණ සඳහා මණ්ඩලය සාමාන්‍ය ණය ගැනීම් සඳහා අදාළ වන ණය ගැනීමේ පිරිවැයේ සාපේක්ෂ මධ්‍යකය භාවිතා කරයි. අනෙකුත් සියලු ණයට ගැනීමේ පිරිවැය ඒවා සිදු කල කාලයට අදාළ ලාභ /අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගනු ලබයි. නිශ්චිත ණය ගැනීම් වල තාවකාලික ආයෝජන මත උපයන ආයෝජන ආදායම්, ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන පිරිවැයෙන් සුදුසුකම් ලබන වත්කම් සඳහා ඔවුන්ගේ වියදම් කිරීම් අඩු කල විට ලැබේ.

4.2. ඔවුන්ගේ තක්සේරුකරණයේ වත්කම් හා පදනම

මූල්‍ය වත්කම් ප්‍රකාශයේ වත්මන් වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් වන්නේ මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ වාර්තාකරණ දින සිට වසරක් ඇතුළත මුදල් වලින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන දේ වේ. වත්මන් වත්කම් හැර අනෙකුත් වත්කම් වන්නේ වාර්තා කරන දිනයේ සිට වසරකට වැඩි කාලයක් රඳවා ගැනීමට මණ්ඩලය තීරණය කරන වත්කම් වේ.

වර්තමාන නොවන වත්කම් දිගු කාලයක් තිස්සේ නැවත තක්සේරු කර නොමැති අතර එම නිසා මූල්‍ය ප්‍රකාශන වල වත්කම් වල වටිනාකම් ලෙස සඳහන් අගයට වඩා වර්තමාන වටිනාකම් වෙනස් විය හැකිය.

4.2.1. දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න

දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න හඳුනාගැනීම හා ගණනය කිරීම, පිරිවැය තක්සේරු කිරීමේදී ලබන අගයෙන් සමුච්චිත ක්ෂය වීම් අඩු කිරීම මගින් සිදු කරන බව වාර්තා වී ඇත. දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වල පිරිවැය යනු මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට දැරීමට සිදු වන වියදම සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් එහි සේවා තත්ත්වයට ගෙන ඒම සඳහා වන ඕනෑම වියදමක් වේ.

අදාළ උපකරණ වල ක්‍රියාකාරිත්වයට ඒකාබද්ධ වී ඇති මිලදී ගත් මෘදුකාංගය උපකරණයේම කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත. දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න කොටස් වලට විවිධ ප්‍රයෝජනවත් අංශ පවතින විට ඒවා දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න වල වෙන් වූ කොටස් (ප්‍රධාන සංරචක) ලෙස සලකනු ලබයි.

4.2.2. පසුකාලීන වියදම්

දේපලක, යන්ත්‍රෝපකරණයක හෝ ආම්පන්නයක කොටසක් නැවත ප්‍රතිස්ථාපනය කිරීම මගින් මණ්ඩලය වෙත අනාගතයේදී ආර්ථික ප්‍රතිලාභ ගලා එයි නම් එය එහි වටිනාකම තුලින් හඳුනා ගෙන ඇති අතර එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි වටිනාකම දේපලෙහි, යන්ත්‍රෝපකරණ වල සහ ආම්පන්න වල එදිනෙදා සේවා සැපයීම ලෙස ලාභ/ අලාභ ප්‍රකාශන වල හඳුනාගෙන ඇත.

4.2.3. ක්ෂයවීම/ ක්‍රමක්ෂය

ක්ෂයවීම, දේපල, යන්ත්‍රෝපකරණසහ ආම්පන්න වල සෑම කොටසකම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලයට වඩා ඍජුවම ලාභය/ අලාභය ලෙස හඳුනා ගත හැකිය. වත්කමක් ක්ෂයවීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි විට වන අතර වත්කම ක්ෂය කිරීම, ඒවා විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති (හෝ විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති බැහැර කිරීමේ ප්‍රවර්ගයකට ඇතුලත් කර ඇති) දිනට පෙර නතර වේ. සින්නක්කර ඉඩම් සඳහා ක්ෂය කිරීම් අය නොකෙරේ.

වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල පහත දී ඇති වේගයෙන් ක්ෂය වීම් සිදු වේ.

අයිතමය	වතුයායන්	ප්‍රධාන ශාඛාව
ගොඩනැගිලි	5%	5%
යන්ත්‍රෝපකරණ හා ආම්පන්න (පැරණි)	33.33%	12.5%
යන්ත්‍රෝපකරණ හා ආම්පන්න (නව)	20%	20%
නල පද්ධති හා වැසිකිලි	5%	5%
මෝටර් වාහන	25%	25%
ලිබඳු හා උපකරණ	12.5%	12.5%
මේරු වගාව	5%	5%
මාර්ග සහ පාලම්	5%	5%
ජල විදුලි බලාගාර	5%	5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර (නව)	20%	20%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	12.5%	12.5%

4.2.4. පරිගණක මෘදුකාංග

ආශ්‍රිත දෘඩාංග සමඟ අභ්‍යන්තරව සම්බන්ධ නොවන පැහැදිලිව හඳුනා ගත හැකි, විශ්වාසනීයව මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා හේතුවන සියලුම පරිගණක මෘදුකාංග අශ්පෘෂ වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

4.2.5. ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය

ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය යනු නව ප්‍රවේශ මාර්ග සහ අනෙකුත් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉඩම් සමෝච්චියන්හි විශාල වෙනස්කම් සිදු කිරීමට දරණ ලද පිරිවැයයි. මණ්ඩලයේ ක්ෂයවීමේ ප්‍රතිපත්තියට අනුව මෙම වර්ගයේ ව්‍යාපෘති (මාර්ග, පාලම් ආදිය) සඳහා වන පිරිවැය ප්‍රාග්ධනීකරණය හා ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

4.2.7. ආයෝජන දේපල (කුලියට ගත් ඉඩම් හා ගොඩනැගිලි)

ආයෝජන දේපල නිසි ලෙස රඳවා තබා ගෙන ඇත්තේ කුලී ආදායම් උපයා ගැනීම් සඳහා හෝ ප්‍රාග්ධන ඇගයීම් සඳහා හෝ එම දෙකම සඳහා මිස සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිණීම් සඳහා හෝ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හෝ සැපයුම් හෝ පරිපාලනමය අරමුණු සඳහා නොවේ. ආයෝජන දේපල මිනිතු ලබන්නේ මූලික පිළිගැනීම් මත පිරිවැය අනුව වන අතර පසුව සිදු වන ඕනෑම වෙනසක් සාධාරණ වටිනාකම්වල් යුත් ලාභයක්/ අලාභයක් ලෙස හඳුනා ගත හැකිය.

ආයෝජන දේපල බැහැර කිරීමෙන් ලැබෙන ලාභයක්/ අලාභයක්(ගණනය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම හා අයිතම වල වර්තාකම අතර වෙනසිනි) ලාභ/ අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගත හැකිය. පෙර දේපලක්, යන්ත්‍රෝපකරණයක් හෝ ආම්පන්නයක් ලෙස වර්ගීකරණය කර තිබූ ආයෝජන දේපලක් විකුණූ විට හැරෙන තන්සේරු කිරීමේ සංචිතයට ඇතුලත් කර ඇති කිසිදු මුදලක් රඳවාගත් ඉපයීම් වෙත මාරු කරනු ලැබේ.

4.2.8. සීමිත ජීවිත ඉඩම් සංවර්ධන වියදම්

නොමේරූ සහ මේරූ වගාවන්

නැවත සිටුවීම් සහ අලුතින් සිටුවීම් සඳහා සෘජුවම ආරෝපණය වන පිරිවැය අස්වැන්න නෙලන කාලය තෙක් නොමේරූ වගාවන් යටතේ වර්ගීකරණය කර ඇත. වෙළඳපොල විසින් තීරණය කරන ලද මිල ගණන් හෝ අගයන් නොමැති නිසා සහ සාධාරන වර්තාකම් මිළිබඳ විකල්ප ඇස්තමේන්තු පැහැදිලිව විශ්වාස කල නොහැකි යයි තීරණය කර ඇති නිසා මණ්ඩලය විසින් තේ, රබර්, කටු පොල් වැනි ජීව විද්‍යාත්මක වත්කම් වල නොමේරූ හා පරිනත වගාවන් එහි පිරිවැය යටතේ ගණනය කරනු ලබන අතර LKAS 16 යටතේ අර්ථ දක්වා ඇති දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න යටතේ ඇති ජීව විද්‍යාත්මක වත්කම් වල ක්ෂය වීම හා මූලික හඳුනා ගැනීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය සපයා ඇති නීන්දුවට අනුකූලව සිදු කරයි.

සාධාරණ වර්තාකම පහසුවෙන් තීරණය කල නොහැකි බැවින් තවාන් පිරිවැය යටතේ පවත්වා ගනු ලැබේ. පිරිවැය, සෘජු ද්‍රව්‍ය, සෘජු සේවකයින් හා සෘජුවම බලපාන හේතුවල සුදුසු අනුපාත වලින් සමන්විත වේ. එවැනි ජීව විද්‍යාත්මක වත්කමක සාධාරණ වර්තාකම විශ්වාසනීයව මැනිය හැකි වූ විට එම අගයෙන් වෙනිසිම සඳහා වැයවන මුදල අඩු කල විට ලැබෙන අගය මණ්ඩලය විසින් ගණනය කරයි.

ඉඩම් සැකසීම, වගා කිරීම් හා භෝග මේරුන තුරු හෝ අස්වැන්න ලබාගන්නා තෙක් සංවර්ධනය කිරීම් සඳහා දැරිය යුතු වන සියලු වියදම් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. භෝග මේරීමෙන් පසු දැරීමට සිදුවන සියලු වියදම් ලාභ/ අලාභ ප්‍රකාශනයේ සෘජුවම හඳුනාගෙන ඇත. නැවත වගා කිරීම් හා නව වගාවන් සඳහා අය කෙරෙන පොදු ගාස්තු වෙන් කරනු ලබන්නේ අදාළ නැවත වගා කිරීම් සහ නව වගාවන් සඳහා වැය කරන ලද ශ්‍රම දින ගණන පදනම් කරගෙන වන අතර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ නොමේරූ ප්‍රදේශ පදනම් කරගෙනය. පොදු වියදම් වල ඉතිරි කොටස ගණනයන් සිදු කරනු ලබන කාල සීමාවට අදාළ වියදම් වේ.

	නොමේරූ අවධිය	අස්වනු නෙලීම් ආරම්භය
තේ	වසර 1-4	5 වන වසර
රබර්	වසර 1 – 6	7 වන වසර

4.2.9. බිම් පිරවීම සඳහා වියදම්

පෙරදි සිදු කරන ලද බිම් පිරවුම් කාර්ය සාධන ඇගයීමට වඩා අපේක්ෂිත අනාගත වාසිදායක තත්ත්වයන් වැඩි, මෙරූ ක්ෂේත්‍ර සඳහා බිම් පිරවුම් ලෙස භූමිය සංවර්ධනය වැය වන මුදල් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. අදාළ මෙරූ වතුයායේ ප්‍රයෝජනවත් ආර්ථිකයක් ඉතිරිව පවතින නව වත්කම් හෝ අපේක්ෂිත බදු කාලය අඩු නම් පිරවුම් වියදම් ක්ෂය වේ.

පිරවුන් වියදම් ප්‍රාග්ධනීකරණය කර නොමැති නම් ඒවා සිදු කල වසරේ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

දැව වගාව

මූලික හඳුනා ගැනීමේදී දැව වගාව සාධාරණ අගයකින් ගණනය කර ඇති අතර සහ සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදීම විකිණීම සඳහා වන වියදම් එනම් ප්‍රවාහනය ඇතුළු විකිණීමට අවශ්‍ය වන වියදම් සියල්ල අන්තර්ගත මුළු වියදම් එම සාදාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

සාධාරණ වටිනාකමක් ඇති දැව වගාවන් විකිණීම සඳහා අඩු පිරිවැයක් දැරීම සහ සාධාරණ වටිනාකම් වෙනස් වීමෙන් එක් එක් වාර්තාකරණ දිනයේදී වැවිලි සඳහා අඩුවන පිරිවැය, ඒවා පැන නගින කාල සීමාව සඳහා ලාභ අලාභ ප්‍රකාශයට ඇතුලත් වේ. වත්කම් පවත්වා ගෙන යාම සඳහා දැරීමට සිදු වන සියලු වියදම් එම අදාළ වර්ෂයේ ලාභ/ අලාභ ප්‍රකාශයට ඇතුලත් වේ.

ජීව විද්‍යාත්මක වත්කම්

මණ්ඩලය විසින් වත්කම අතීත කටයුත්තක ප්‍රතිඵලයක් ලෙස පාලනය කරයි නම් ජීව විද්‍යාත්මක වත්කම්, පිළිගැනීම සඳහා සුදුසුකම් ලබයි. වත්කම් හා බැඳුනු අනාගත ආර්ථික ලාභයන් මණ්ඩලය වෙත ගලා එන අතර සාධාරණ අගය හෝ වත්කමේ වියදම නිරවද්‍ය ලෙස ගණනය කල හැකි වේ.

4.2.10. භාණ්ඩ ලේඛනය

යල් පැනගිය සහ අඩුවෙන් විකිණෙන භාණ්ඩ සඳහා නිසි දීමනා ලබා දීමෙන් පසු නිෂ්පාදන තොග සහ තවාන් හැර අනෙකුත් භාණ්ඩ වියදම් අඩු සහ ශුද්ධ අගයන් ඇති භාණ්ඩ ලෙස සඳහන් වේ. භාණ්ඩ ලේඛන සඳහා වියදම් නියම කිරීමේදී මණ්ඩලය විසින් FIFO ක්‍රමවේදය යොදා ගනියි. මෙම වියදම් සඳහා කොටස් ලබා ගැනීම, නිෂ්පාදනය සහ පරිවර්තන වියදම් සහ පවතින ස්ථානට සහ තත්වයට ළඟා කර ගැනීමට දැරිය යුතු වූ වියදම් ආදිය අන්තර්ගත වේ. ශුද්ධ වටිනාකම ලෙස අදහස් වන්නේ තක්සේරුකරණ ලද වටිනාකමෙන් භාණ්ඩය සම්පූර්ණ කිරීමට තක්සේරු කරන ලද වියදම හා භාණ්ඩය විකිණීම සඳහා දැරීමට සිදු වන වියදම් ලෙස තක්සේරු කරන ලද වියදම් අඩු කල විට ලැබෙන අගයයි.

ශේෂ පත්‍රයේ සඳහන් දිනය තෙක් නිපදවන ලද භාණ්ඩ වල වටිනාකම් අධිගත් අගය අනුව ගණනය කරන ලදී. ඉතිරි තොගයේ වටිනාකම් තක්සේරුගත විකුණුම් මිල අනුව ගණනය කරන

ලදී. මෙම අගයෙන් ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා වියදම් වන සියලු මුදල් අඩු කල විට ලැබෙන ශුද්ධ අගය වේ.

තේ කිලෝග්‍රෑම් 1ක නිෂ්පාදන පිරිවැය සෑම විටම ගණනය කල ශුද්ධ අගයට වඩා ඉහළ වේ.

<u>මූල්‍යමය වත්කම්</u>

LKAS 39 විෂය පථය තුල ඇති මූලික හඳුනාගැනීම සහ මූල්‍ය වත්කම් මැනීම ලාභ හෝ අලාභ, ණය හා ලැබිය යුතු මුදල්,කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන, විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් හෝ කොටු කිරීමේ උපකරණ ලෙස නිමිති කල දේ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේදී මණ්ඩලය විසින් එහි වර්ගීකරණය සිදුකරනු ලැබේ.

සියලු මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර ලාභය හෝ අලාභය ලෙස සාධාරණ වටිනාකමකින් නොමැති වත්කම් සඳහා ගනුදෙනු පිරිවැය යොදා ගනියි. වෙළඳපොලේ (සාමාන්‍ය වෙළඳාම්) රෙගුලාසි හෝ ගිවිසුම් අනුව ස්ථාපිත කරන ලද කාල රාමුවක් තුල බෙදා හැරීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් හඳුනා ගැනීම, මිලදී ගැනීම හෝ විකිණීම වෙළඳාම් කරන දිනයේදී එනම් මණ්ඩලය විසින් වත්කම මිලදී ගැනීම හෝ විකිණීම සිදු කිරීමට පවරන දිනයේදී සිදු කල යුතුය. මණ්ඩලයේ මූල්‍ය වත්කම් වලට මුදල් හෝ මුදල් වලට සමාන දේ, කෙටි කාලීන තැන්පතු, ණය සහ සැපයුම්කරුවන්ට දෙන ලද අත්තිකාරම්, විකුණුම් සහ අනෙකුත් ලැබිය යුතු ආදායම් අයත් වේ.

<u>පසුව සිදුකරන ගණනය කිරීම්</u>

මූල්‍ය වත්කම් වල පසුව සිදුකරන ලද ගණනය කිරීම් පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කරනු ලැබේ.ලාභය හා අලාභය තුලින් සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් වලට වෙළඳාම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මූලික පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් නුදුරු කාලීනව විකිණීම හෝ මිලදී ගැනීම සඳහා අත්පත් කර ගනු ලැබුවහොත් ඒවා වෙළඳාම සඳහා තබා ඇති ලෙසට වර්ගීකරණය කර ඇත. LKAS 39 මඟින් අර්ථ දක්වා ඇති පරිදි ඉදිරියේදී ආරක්ෂා වීමේදී ඇතිවන සම්බන්ධතා වල ආරක්ෂිත උපකරණ ලෙස නම් කර නොමැති මණ්ඩලය විසින් ඇතුලත් කර ඇති ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මෙම කාණ්ඩයට ඇතුලත් වේ. වෙන් කල කාවැද්දූ ව්‍යුත්පන්නයන් ඇතුළු ව්‍යුත්පන්නයන් ඵලදායී ඉදිරි ආරක්ෂක උපකරණ ලෙස නම් නොකලහොත් වෙළඳාම සඳහා රඳවා ඇති ඒවා ලෙස වර්ගීකරණය කර ඇත. සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම් මූල්‍ය තත්ත්වය දක්වන ප්‍රකාශයේ ලාභ හෝ අලාභ ලෙස දක්වා ඇත. ආදයම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් හෝ මූල්‍ය වියදම් ලෙස සාධාරණ අගයේ සිදු වූ වෙනස්කම් දක්වා ඇත. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීම සුදුසු දැයි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් සාධාරණ අගයක් මත ලාභ හා අලාභය මඟින් ඇගයීමක් කරන ලදී. අක්‍රිය වෙළඳපොළවල් නිසා මණ්ඩලයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වූ නිසා ඒවා අනාගතයේදී විකිණීමට කළමනාකාරීත්වය අරමුණු කරගෙන ඇත.

සැලකිය යුතු ලෙස වෙනස් වූ විට මෙම මූල්‍ය වත්කම් දුර්ලභ අවස්ථාවන්හි වර්ගීකරණය කිරීමට මණ්ඩලය තෝරා ගත හැකිය. ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ වර්ගීකරණය කිරීම, විකිණීමහෝ කල් පිරෙන තෙක් තබා ගැනීම වත්කම් වල ස්වභාවය මත රඳා පවතියි.

<u>ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම්</u>

විකිනීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සහ ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයක් සහිත ලෙස මූලිකව හඳුනාගෙන ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වේ. විකිනීමෙදි හෝ නුදුරු කාලයේදි නැවත මිලදී ගැනීමේ අරමුණකින් තබා ගත් මූල්‍ය වත්කම්, විකිණීම සඳහා තබා ඇති දේ ලෙස වර්ගීකරණය කර ඇත. LKAS 39 හි අර්ථ දක්වා ඇති පරිදි මෙම කාණ්ඩයට ඉදිරි රැකුම් සම්බන්ධතා වල රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති මණ්ඩලය විසින් ඇතුලත් කරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ඇතුලත් වේ. වෙනම පවතින ව්‍යුත්පන්න ඇතුළු ව්‍යුත්පන්න ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති නම් විකිණීම සඳහා පවතින ලෙස වර්ගීකරණය කර ඇත. සාධාරණ අගයන් සහිත මූල්‍ය වත්කම් මූල්‍ය තත්ත්වය දක්වන ප්‍රකාශයේ ලාභ හෝ අලාභ ලෙස දක්වා ඇත. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් හෝ මූල්‍ය වියදම් ලෙස සාධාරණ අගයේ සිදු වූ වෙනසක් දක්වා ඇත.
මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීම සුදුසු දැයි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් සාධාරණ අගයක් මත ලාභය හෝ අලාභය මඟින් ඇගයීමක් කරන ලදී. අක්‍රීය වෙළඳපොළවල් නිසා මණ්ඩලයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වූ නිසා ඒවා අනාගතයේදී විකිණීමට මණ්ඩලය අරමුණු කරගෙන ඇත.
සැලකිය යුතු ලෙස වෙනස් වූ විට මෙම මූල්‍ය වත්කම් දුර්ලභ අවස්ථාවන්හි වර්ගීකරණය කිරීමට මණ්ඩලය තෝරා ගත හැකිය. ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ වර්ගීකරණය කිරීම, විකිණීම හෝ කල් පිරෙන තෙක් තබා ගැනීම වත්කම් වල ස්වභාවය මත රඳා පවතියි.

<u>ණය සහ ලැබිය යුතු දේ</u>

ණය සහ ලැබිය යුතු දේ යනු ක්‍රියාකාරී වෙළඳපොලක සඳහන් නොවන ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීම වලින් අනතුරුව, එවැනි මූල්‍ය වත්කම් අඩු අපහායනය සහිත කාර්යක්ෂම පොලි අනුපාත ක්‍රමයක් යටතේ (EIR) ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. ක්‍රමක්ෂයපිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම් සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ EIR හි අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. EIR ක්‍රමක්ෂයආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ අන්තර්ගත කර ඇත.

<u>විකිණීම් සඳහා පවතින මූල්‍ය ආයෝජන</u>

විකිනීම සඳහා ලබා ගත හැකි මූල්‍ය වත්කම් යනු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ඒවා විකිණීම් සඳහා ලබා දී ඇති පරිදි නම් කර ඇති අතර ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණයෙන් වර්ගීකරණය කර නොමැත. විකිණීම සඳහා ලබා ගත හැකි මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමකින් සහ ඍජුවම ආරෝපණය කල හැකි ගනුදෙනු පිරිවැයකින් හඳුනා ගැනේ. මූලික හඳුනාගනීමකින් අනතුරුව ඒවා මනිනු ලබන්නේ හානිකර පාඩු සහ පවතින ණය උපකරණ වල විදේශ මුදල් වෙනස හැරුණු විට සාධාරණ වටිනාකම් සහ ගාස්තු අනුව වන අතර වෙනත් පුළුල් ආදායමකින් හඳුනාගෙන සාධාරණ කොටස් සංචිතයේ සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලැබේ. ආයෝජනයක් හඳුනා නොගත් විට කොටස් වල එකතු වී ඇති ලාභය හෝ අලාභය ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය කෙරේ. විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්, කොටස් සුරැකුම්පත් සහ ණය සුරැකුම්පත් වලින් සමන්විත වේ.

පිළි නොගැනීම

මූල්‍ය වත්කමක් (හෝ අදාළ ස්ථාන වලදී මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සහිත මණ්ඩලයකින් කොටසක්) පිලි නොගැනීම සිදු වන්නේ එම වත්කමින් මුදල් ඉපයීමේ අයිතිය කල් ඉකුත් වූ විටය. වත්කම මඟින් ලැබෙන මුදල් ලබා ගැනීමේ අයිතිය මණ්ඩලය විසින් පවරා දී ඇත. නැතහොත් කිසියම් විධිවිධානයක් හරහා තෙවන පාර්ශවයකට ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් සම්පූර්ණ ගෙවීමට බැදී සිටියි. මණ්ඩලය විසින් (a) වත්කම් වල සියලු අවධානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති හෝ (b) වත්කම් වල සියලු අවධානම් සහ ප්‍රතිලාභ මාරු කිරීම හෝ රඳවා තබා ගැනීම් සිදු කර නොමැති නමුත් වත්කම් පාලනය කිරීම පවරා ඇත.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා මණ්ඩලය සිය අයිතිවාසිකම් මාරු කර ඇති විට හෝ විධිවිධානයක් හරහා ගමන් කර ඇති විට සහ වත්කම් වල සියලු අවධානම් සහ විපාක සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන නොමැති විට සහ එහි පාලනය මාරු කර නොමැති විට මණ්ඩලය විසින් එයට අවණ්ඩව සම්බන්ධ වන තරමට එම වත්කම් හඳුනා ගැනීම සිදුවේ.

එවැනිඅවස්ථාවක මණ්ඩලය විසින් හවුල් වගකීමක් හඳුනා ගනියි. පැවරූ වත්කම හා හවුල් වගකීම ගණනය කිරීම මණ්ඩලය රඳවාගත් අයිතිවාසිකම් හා බන්ධනය මඟින් පිළිඹිබු වේ.

මූල්‍ය වත්කම් අපහායනය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයක් අපහායනය වූවාදැයි පරීක්ෂා කිරීමට මණ්ඩලය විසින් සෑම වාර්තාකරණ දිනයකදීමඇගයීමක් සිදු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයක් දුර්වල යැයි සලකනු ලබන්නේ වත්කම මුලින් හඳුනා ගැනීමෙන් පසුව සිදුවන සිදුවීම් එකක් හෝ වැඩි ගණනාක ප්‍රතිඵානියන් ලෙස හානියක් සිදු වූ බවට වෛෂයික සාක්ෂි තිබේ නම් සහ එම මූල්‍ය වත්කමට හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයේ අනාගත මුදල් ලැබීම් වලට තක්සේරු කල හැකි බලපෑමක් සිදු වන්නේ නම් පමණි.

හානිය පිළිබඳ සාක්ෂි වලට සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්දකින ණය ගැනියන් හෝ ණය මණ්ඩලයක් ඇති බවට සාක්ෂි, පොලි හෝ මූලික ගෙවීම් පැහැර හැරීම් හෝ අඩුපාඩුකම්, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට සහ අනාගත මුදල් ලැබීම් මැනිය හැකි ලෙස අඩුවිය හැකි එනම් ගිහ මුදල් වල වෙනස්කම් හෝ සම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් අන්තර්ගත විය හැකිය.

මූල්‍ය වගකීම්

මූලික හඳුනා ගැනීම සහ මිනුම්

LKAS 39 විපසරිය තුල පවතින මූල්‍ය වගකීම් යෝග්‍ය ලෙස ලාභ හෝ අලාභ ලෙස සාධාරණ අගයන් සහිත මූල්‍ය වගකීම්, ණය හා ණයට ගැනීම්, ඵලදායී රැකුමක රැකුම් උපකරණයක් ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කල හැකිය. මූලික හඳුනා ගැනීමේදී මණ්ඩලය විසින් අදාළ මූලික වගකීමේ වර්ගීකරණය හඳුනා ගනියි.

සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයකින් හඳුනා ගන්නා අතර ණය හෝ ණයට ගැනීම් සැලකීමේදී ක්‍රමක්ෂය පිරිවැය සලකයි. මේ සඳහා සෘජුවම ආරෝපණය කල හැකි ගනුදෙනු පිරිවැය අන්තර්ගත වේ. මණ්ඩලයේ මූල්‍ය වගකීම් වලට වෙළදාම් හා අනෙකුත් ගෙවිය යුතු දේ, බැංකු අයිරා සහ ණයට ගැනීම් අන්තර්ගත වේ.

පසුව සිදු කරන ගණනය කිරීම්

මූල්‍ය වන්කම් මැනීම ඔවුන්ගේ පහත වර්ගීකරණය මත තීරණය වේ.

ලාභ/ අලාභ ලෙස සාධාරණ අගයක් සහිත මූල්‍ය වගකීම්

ලාභ/ අලාභ ලෙස සාධාරණ අගයක් සහිත මූල්‍ය වගකීම් වලට වෙළඳ කටයුතු සඳහා පවතින මූල්‍ය වගකීම් හා ලාභ/ අලාභ ලෙස සාධාරණ අගයකින් මූලික හඳුනා ගැනීමේදීම හඳුනාගත් මූල්‍ය වගකීම් ඇතුලත් වේ.

මූල්‍ය වගකීම් වෙළඳ කටයුතු සඳහා තබා ඇති.ලෙස වර්ගීකරණය කර ඇත්තේ ඒවා නුදුරු අනාගතයේදී විකිණීමේ අරමුණ ඇතිව ලබා ගත්තේ නම්ය. LKAS 39 ට අනුව රැකුම් සබඳතා වල රැකුම් උපකරණ ලෙස හඳුනා ගෙන නොමැති මණ්ඩලය මඟින් ඇතුළු වූ ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් මෙයට ඇතුලත් වේ. වෙන්කළ කාවැද්දූ ව්‍යුත්පන්න ඵලදායී රැකුම් උපකරණ ලෙස හඳුනාගෙන නොමැති නම් ඒවාද වෙළඳ කටයුතු සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කරයි.වෙළඳ කටයුතු සඳහා ගෙන ඇති වගකීම් වල ලැබීම් හා වියදම් වීම් ලාභ හා අලාභ තුලින් හඳුනා ගනියි. මූලික හඳුනා ගැනීම තුල ලාභ/ අලාභ ලෙස සාධාරණ අගයක් ඇති මූල්‍ය වගකීම් මණ්ඩලය විසින් හඳුනාගෙන නොමැත.

ණය සහ ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මත පොලී දරණ ණය සහ ණයට ගැනීම් පසුව මැනීම සිදු කරයි. වගකීම් හඳුනා නොගත් විට ආදායම් ප්‍රකාශයෙන්ද ක්‍රමක්ෂය ක්‍රියාවලියේ ඵලදායී පොලී අනුපාත ක්‍රමයෙන්ද (EIR) ලැබීම් හා වියදම් හඳුනා ගනියි.

ක්‍රමවේදය පිටුවදය ගණනය කරනු ලබන්නේ අන්‍යෝන්‍ය කරගැනීම් සහ ගාස්තු හෝ පිටුවදය පිළිබඳ කිසියම් විවිධත්වයක් සැලකිල්ලට ගෙන එන අතර එය ඵලදායී පොලී අනුපාත ක්‍රමයේ අනිවාර්ය අංගයකි. ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් වල අන්තර්ගත කර ඇත.

<u>හඳුනා නොගැනීම්</u>

වගකීම් යටතේ ඇති බැඳීම් නිදහස් කල විට, අවලංගු කල විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනා නොගැනීම් සිදු වේ. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් වෙනත් අයකු විසින් සැලසිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කල විට හෝ පවත්නා වගකීම් පිළිබඳ කොන්දේසි සැලසිය යුතු ලෙස වෙනස් කල විට එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් සලකනු ලැබේ.

මුල් වගකීම හඳුනා නොගැනීම් සහ නව වගකීමක් හඳුනා ගැනීම් සහ අදාළ රැගෙන යන ප්‍රමාණයන්හි වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

<u>මූල්‍ය උපකරණ හිලව් කිරීම්</u>

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තා කර ඇති ශුද්ධ මුදල් සමඟ හිලව් වන්නේ පිළිගත් මුදල් පියවා ගැනීමට, ශුද්ධ පදනම් මත පියවීමට හෝ වත්කම් සාක්ෂාත් කර ගැනීමට හෝ වත්කම් එකවර පියවීමට වර්තමාන බලාත්මක කල හැකි නීතිමය අයිතියක් තිබේ නම් පමණි. මණ්ඩලයේ ගිණුම් පිළිවෙත් වල විශේෂයෙන් සඳහන් කර ඇති පරිදි කිසියම් ගිණුම් සම්මතයක් හෝ අර්ථ නිරූපනයක් සඳහා අවශ්‍ය වන හෝ අනුමැතිය ලබා දී හෝ නොමැති නම් ආදායම් ප්‍රකාශය තුල ආදායම් හා වියදම් හිලව් නොකරනු ඇත.

<u>මූල්‍ය උපකරණ වල සාධාරණ අගය</u>

සෑම වාර්තා කරන දිනයකදීම ක්‍රියාකාරී වෙළඳපොල තුල වෙළඳාම් කල මූල්‍ය උපකරණ වල සාධාරණ අගය, ගනුදෙනුව සඳහා වන කිසිදු වියදමක් අඩු නොකර උපුටා ගත් වෙළඳපොල මිල හෝ බෙදා හරින්නාගේ මිල ගණන් (දිගු කාලීනව ලන්සු තබා කෙටි කාලීන මිල විමසීම) අනුව හඳුනා ගනියි. ක්‍රියාකාරී වෙළඳපොල තුල වෙළඳාම් සිදු නොවන මූල්‍ය උපකරණ වල සාධාරණ මිල යෝග්‍ය තක්සේරු ක්‍රමවේද අනුව හඳුනා ගනියි.

එවැනි ක්‍රමවේද සඳහා මෑත කාලයේ වෙළඳපොල ගනුදෙනු ලබාගැනීම, මෙයට සමාන වෙනත් මූල්‍ය උපකරණයක සාධාරණ අගය ගැනීම, විට්ටම් සහිත මුදල් ගැලුම් සමාලෝචනය හෝ අනෙකුත් තක්සේරු කරන ක්‍රමවේද ආදිය අන්තර්ගත වේ.

<u>ප්‍රතිපාදන, අවිනිශ්චිත වගකීම්, අවිනිශ්චිත වත්කම්</u>

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට, වර්තමාන වගකීමක් (නෛතික හෝ ඉදිකිරීම්) ඇතිවිට සහ සම්පත් පිටතට ගලා යාම මඟින් ආර්ථික වාසි ඇතිවන බවට අනුමාන කල හැකි විට වගකීම් පියවිය යුතු අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කල හැකිය.

සම්පත් පිටතට ගලා යාම් විදුර නොවේ නම්, සියලු අවිනිශ්චිත වගකීම් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස අනාවරණය වේ. ආර්ථික ලාභ ලැබීමක් සිදු විය හැකි නම් අවිනිශ්චිත වත්කම් අනාවරණය වේ.

4.2.9 වෙළඳාම සහ අනෙකුත් ලැබීම්

ළඟා කර ගැනීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන් සහ අයහපත් සහ සැක සහිත ණය සඳහා ශුද්ධ ප්‍රතිපාදන අගයන් අනුව වෙළඳාමෙන් ලැබිය යුතු දේ සඳහන් කර ඇත.

4.2.10. මුදල් හෝ මුදල් වලට සමාන දෑ

මුදල් හෝ මුදල් වලට සමාන දෑ මුදල් ශේෂයන්, ස්ථිර තැන්පතු සහ ඇරයුම් තැන්පතු වලින් සමන්විත වේ. ඉල්ලුම් අනුව නැවත ගෙවිය යුතු සහ මණ්ඩලයේ මූල්‍ය කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා මුදල් ප්‍රවාහයන් වල අරමුණක් ලෙස මුදල් හෝ මුදල් වලට සමාන දේ වලට අන්තර්ගත කර ඇත.

වක්‍රාකාර ක්‍රමයක් මත පදනම්ව සකස් කරන ලද මුදල් ගැලීමේ ප්‍රකාශයේ නිරූපණය කිරීම සඳහා ගෙවන ලද පොලිය මෙහෙයුම් මුදල් ගැලීමක් ලෙසත් ලැබුණු පොලිය ආයෝජන මුදල් ගැලීමක් ලෙසත් වර්ගීකරණය කර ඇත.

5. වගකීම් සහ ප්‍රතිපාදන

5.1. සේවකයින්ගේ විශ්‍රාමික වරප්‍රසාද

(a) පවතින වරප්‍රසාද සැලසුම්

සුදුසුකම් සපුරා ඇති සේවකයින්ට 1983 අංක 13 දරණ පාරිතෝෂික ගෙවීම් පනත සහ 1978 අංක 34 දරණ ඉන්දියානු දේශප්‍රත්‍යාවර්තන පනතට අනුව විශ්‍රාමික වරප්‍රසාද සැලැස්මක් සකස් කර ඇත. විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය මත LKAS 19 ට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී නොමැත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව සේවකයින් සඳහා ගෙවීමේ වගකීම අඛණ්ඩ පස් අවුරුදු සේවා කාලයකට පසුව මතු වේ. මූල්‍ය ප්‍රකාශන වලට ඇති සටහන් වල වගකීම් අන්තර්ගත කර ඇත.

(b) පැරණි සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික

2016 දෙසැම්බර් 31 දිනට වතුයායේ සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා නිවැරදිව ගණනය කර වතුයායේ ගිණුම් වල ඇතුලත් කර ඇත. පැරණි සේවකයින් සඳහා ගෙවිය යුතු මුදල් 2016 දෙසැම්බර් වන විට රු. 512,688,406.22 ක් වේ.

(c) පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

විශ්‍රාමික පාරිතෝෂික සඳහා සියලු සේවකයින්ගේ සේවයේ පළමු වසරේ සිට ප්‍රතිපාදන වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇත. පාරිතෝෂික වලට අදාලව ශේෂ පත්‍රයේ හඳුනා ගත් වගකීම් යනු වාර්තා කරන කාල සීමාව අවසන් වූ විට බැඳීමේ වර්තමාන වටිනාකම වේ.

මණ්ඩලය විසින් සෑහෙන කාලයකින් ආයුගණන තක්සේරුවක් සිදු කර නොමැත.

(d) නිශ්චිත දායකත්ව සැලසුම් (EPF, ETF, ESPS, CPPS)

නිශ්චිත අර්ථසාධක අරමුදලට සහ සේවක විශ්වාසී අරමුදලට සුදුසුකම් ලබා ඇති සියලු සේවකයින් අදාළ ප්‍රතිපත්ති සහ රෙගුලාසි වලට අනුකූලව අදාළ දායක අරමුදල් මඟින් ආවරණය කෙරේ. සේවකයින්ගේ දල වැටුප් අනුව 12% ක් EPF, ESPS, CPPS අරමුදල් සඳහාද 3% ක් ETF අරමුදල සඳහාද මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

2001 සිට 2016 තෙක් නියම කරන ලද කාලය තුල EPF, ETF සහ ESPS, CPPS, EPF ETF මණ්ඩලය වෙත ප්‍රේෂණය කර නොමැත. නම්කරු කොමසාරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව නීතිමය පියවර ගෙන ඇත.

2016/12/31වන දිනට ශේෂයන්

ගෙවිය යුතු EPF (2002 සිට 2016)	රු. 381,475,551.78
ගෙවිය යුතු ETF (2002 සිට 2016)	රු. 32,367,336.73
ගෙවිය යුතු ESPS (2002 සිට 2016)	රු. -19,139,467.04
ගෙවිය යුතු CPPS (2002 සිට 2015)	රු. 3,200,017.96
EPF/ETF ගැටළු	රු. 502,339,066.59

5.3 රාජ්‍ය ප්‍රධානයන්

දේපලක්, යන්ත්‍රෝපකරණයක් හා ආම්පන්නයක් විලදී ගැනීමට අදාළ රාජ්‍ය ප්‍රධානයන් ගණනය කරනු ලබන්නේ පිරිවැයෙන් අපහායන හානිය අඩු කිරීමෙන් වන අතර ඒවා ලැබෙ යැයි සාධාරණ සහතිකයක් පවතින විට ඒවා මූලිකව හඳුනා ගත් සාධාරණ අගයකින් යුක්ත විලම්බිත ආදායමක් ලෙස පිළිගැනේ. තවද මණ්ඩලය ප්‍රදාහය හා සම්බන්ධ කොන්දේසි වලට අවනත වනු ඇති අතර අදාළ වත්කම් වල අපේක්ෂිත ජීවිත වලට වඩා සරල රේඛීය පදනම මත ලාභ අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගනු ලැබේ.

මණ්ඩල වියදම් හෝ දැනටමත් සිදු වී ඇති පාඩු සඳහා වන්දි ලබාදෙන ප්‍රධාන, ලැබිය යුතු කාල සීමාව සහ වියදම් හඳුනා ගත් විට වෙනත් ආදායමක් ලෙස ලාභය හෝ අලාභය දක්වන ප්‍රකාශය මඟින් හඳුනා ගැනේ

සලකන වර්ෂය සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයෙන් රු. 511,689,820.00 ක මුදලක් ලැබුණි.

වෙළඳ ගෙවීම්

වෙළඳ ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබා ගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට බැඳී සිටීමයි. ගෙවීම් වසරක් හෝ ඊට අඩු කාලයක් තුල ගෙවිය යුතු නම් ගෙවිය යුතු ගිණුම් වර්තමාන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. එසේ නොමැති නම් ඒවා වර්තමාන නොවන වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත. වෙළඳ ගෙවීම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනා ගෙන පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිටිවැයෙන් මනිනු ලැබේ.

බදුකරණය

වත්මන් බද්ද

බදු ව්‍යදම් වත්මන් බදු හා විලම්බිත බදු වලින් සමන්විත වේ. වර්තමාන සහ පෙර කාල පරිච්ඡේදයන් සඳහා පවත්නා ආදායම් .බදු වත්කම් හා වගකීම් මනිනු ලබන්නේ බදු අයකර ගැනීමේ බලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණය අනුවය. මූදල් ගණනය කිරීම් සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති යනු ශේෂ පත්‍රයේ දිනය අනුව බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද ඒවාය. ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති පරිදි ආදායම් හා ව්‍යදම් වල අංගයක් මත වන අතර 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන හා ඒ සඳහා වන සංශෝධන අනුව ගණනය කෙරේ.

5.3. ආදායම් ප්‍රකාශය

ආදායම්

මණ්ඩලය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති තාක් දුරට ආදායම හඳුනා ගෙන ඇති අතර ගෙවීම් සිදු කරන්නේ කුමන අවධියක වුවත් ආදායම පහසුවෙන් මැනිය හැකිය. භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබෙන දේ වල සාධාරණ වටිනාකම්, ශුද්ධ ප්‍රතිලාභ හා දීමනා, වෙළඳ වට්ටම් හා පරිමා වට්ටම් මතය. සැලකිය යුතු අවධානම් හා ප්‍රතිලාභ ගැනුම්කරු වෙත මාරු කර ඇත්නම්, සලකා බලන ලද අගය යථාර්ථයක් කර ගැනීමට හැකියාවක් පවතියි නම් ඒ හා සම්බන්ධ පිරිවැය හා භාණ්ඩ වල ප්‍රතිලාභ විශ්වාසදායක ලෙස තක්සේරු කල හැකි නම්, භාණ්ඩ සමඟ අබණ්ඩ කළමනාකරණ මැදිහත්වීමක් නොමැති නම් හා ආදායම් ප්‍රමාණය විශ්වාසව මැනිය හැකි නම් ආදායම හඳුනා ගත හැකිය.

වාර්තා කරන දිනයේදී ගනුදෙනුව අවසන් කිරීමේ අදියරට සමානුපාතිකව ඉටුකරන ලද සේවාවන්ගෙන් ලැබෙන ආදායම් ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. සිදු කරන ලද කාර්යයන් පිළිබඳ සම්ක්ෂණය මඟින් සම්පූර්ණ කිරීමේ අදියර තක්සේරු කරනු ලැබේ.අරමුණු වල හිමිකාරීත්වයේ සැලකිය යුතු අවධානම් සහ ප්‍රතිලාභ ආයතන විසින් මාරු කරනා වෙලාව නිරණය කිරීම සඳහා මණ්ඩලය පහත සඳහන් ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.

(a) වෙන්දේසියේදී තේ විකිණීම

ලංකා තේ වෙළඳුන්ගේ සංගමය (17 වන කොටස) විසින් නිකුත් කරන ලද තේ වල නීති හා කොන්දේසි වලට අනුව වැඩිම ලංපුකරු පිළිගනු ලබන අතර මිටිය පහළට වැටෙන අවස්ථාවේදී විකිණීම අවසන් කල යුතුය. විකිණීමේ වටිනාකම තීරණය කරනු ලබන්නේ එකහ වූ මිල හා ප්‍රමාණය අනුව සහ විකුණුම් සටහන් ඉහළට එසවීමෙන් වේ.

(b) වෙන්දේසියේදී රබර් විකිණීම

කොළඹ රබර් වෙළඳුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද රබර් වල නීති හා රෙගුලාසි වලට අනුව ලංපුකරු පිළිගනු ලබන අතර මිටිය පහලට වැටෙන අවස්ථාවේ විකිණීම අවසන් කල යුතුය. විකිණීමේ වටිනාකම තීරණය කරනු ලබන්නේ එකහ වූ මිල සහ ප්‍රමාණය අනුව සහ විකුණුම් සටහන් ඉහළට එසවීමෙන් වේ.

(c) දැව වගාව අස්වනු නෙලීම

නෛතික හිමිකාරිත්වය සහ ගැණුම්කරුට අලාභ මාරු වීමේ අවධානම සහ විකුණන ප්‍රමාණය තීරණය කල විට දැව විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

(d) දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හා අලාභ

ලාභය හෝ අලාභය තීරණය වන්නේ ශුද්ධ විකුණුම් ආදායම රැගෙන දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න සමහ සංසන්ධනය කිරීමෙන් වන අතර එම වත්කම් වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන "වෙනත් සුදුසුකම් සහිත වත්කම්" තුල ශුද්ධ ලෙස හඳුනා ගැනේ.

(e) බදු ආදායම්

මණ්ඩලය විසින් ඉඩම් හා කර්මාන්ත ශාලා විවිධ පාර්ශවයන්ට බදු දී ඇති අතර ඔවුන්ගෙන් ලැබෙන ආදායම බදු ආදායම් ලෙස හඳුනාගෙන ඇත. ඒවා ලැබීම් මත ගණනය කරයි (මාසිකව සහ වාර්ෂිකව).

(f) රාජ්‍ය දීමනා

ප්‍රදානයන් මුලින් හඳුනා ගනු ලබන්නේ ඒවා ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ මණ්ඩලය ප්‍රදානය හා සම්බන්ධ කොන්දේසි වලට අනුකූල වන විටය. වියදම් සඳහා මණ්ඩලය විසින් වන්දි ලබාදෙන ප්‍රදාන, පිරිවැය හඳුනාගත් කාල පරිච්ඡේදයන් තුල ක්‍රමානුකූල පදනමක් මත ලාභ හා අලාභ ප්‍රකාශය මඟින් හඳුනා ගැනේ.

5.3.2. වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දරනු ලබන සියලු වියදම් වර්ෂය සඳහා ලබා ගැනීමේදී ආදායමට අය කෙරේ. අලුත්වැඩියා කිරීමේ හා අලුත් කිරීමේ වියදම් සිදුවූ වර්ෂයේ ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙන් අය කිරීම සිදු වේ.

මූල්‍ය පිරිවැය

ණය ගැනීමෙන් ඇති වූ පොලී වියදම, ලාභ හෝ අලාභ ලෙස සාධාරණ අගයකින් සමන්විත මූල්‍ය වත්කම් වල සාධාරණ අගයෙන් අය කරන ගාස්තුව, හා ලාභ හෝ අලාභ ප්‍රකාශය මඟින් හඳුනාගත් රැකුම් උපකරණ මඟින් සිදුවන අලාභයන් මූල්‍ය පිරිවැයට අන්තර්ගත වේ. සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය නොවන ණය ගැනීමේ පිරිවැය ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභ හා අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගැනේ. වගකීම් වල ඉතිරි ශේෂය මත නියත වරින්වර පොලී අනුපාතයක් බිඳි කිරීම සඳහා මූල්‍ය කල් බදු ගෙවීම් වල පොලී වියදම් සංරචකය බදු කාල සීමාව තුල එක් එක් කාල පරිච්ඡේදයට වෙන් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන

ලැබෙන පොලිය මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කර ඇති අතර ගෙවනු ලබන පොලිය "චක්‍ර ක්‍රමය" භාවිතයෙන් සකස් කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කර ඇත.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2016.12.31 දිනට මූල්‍ය තත්වය

	සටහන්	31.12.2016	31.12.2015
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
වැඩිදියුණු නොකල ඉඩම්,පැවරූ පරිනත වැවිලි හා වෙනත් වත්කම්	FA-01	2,630,524.94	2,630,524.94
දියුනු කල ඉඩම්, මාර්ග හා පාලම්,ලයින් නිවාස හා වැසිකිළි, ගොඩනැගිලි ,ගබඩා	FA-02	1,475,628,673.91	1,476,895,973.49
පරිනත නොවූ වැවිලි	FA-03	263,444,952.97	251,449,475.89
පරිනත වැවිලි	FA-04	357,352,371.91	355,915,701.84
යන්ත්‍ර සුත්‍ර කාර්යාල උපකරණ හා රථවාහන	FA-05	54,379,728.75	66,541,544.48
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	FA-06	3,272,006.63	3,548,008.88
ලිඛිඩු හා සවිකිරිම	FA-07	1,237,916.92	1,214,632.93
ජල සම්පාදන යෝජනා ක්‍රම හා කුඩා ජල විදුලි යෝජනා ක්‍රම සහ අන්කම් නිවාස	FA-08	11,398,956.00	12,207,529.47
ආරක්ෂිත වැට විදුලි ආලෝකය, ගිනිසිරියා වගාව	FA-09	219,393.94	220,593.94
උනුගල්ඔය වත්තේ ස්ථාවර වත්කම්, නොනිමි ප්‍රාග්ධන වැඩ	FA-10	29,438,568.60	35,968,388.10
බදු වත්කම්		32,168,954.60	32,168,954.60
		2,231,172,049.17	**2,238,761,328.56**
ජංගම වත්කම්			
භාණ්ඩ ලැයිස්තුව	A1	94,292,580.38	63,411,589.84
ලැබිය යුතු වෙළඳ හා වෙනත්	A2	570,313,557.12	550,234,588.24
මුදල් හා චෙක්පත්	A3	10,659,130.04	4,423,511.91
ගෙලපිම්	A4	11,190,988.07	11,190,988.07
		686,456,255.61	**629,260,678.06**
		2,917,628,304.78	**2,868,022,006.62**
වගකීම්			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රාග්ධනය		3,670,000,000.31	3,670,000,000.31
සමුච්චිත අලාභ		(8,469,369,706.99)	(7,862,672,540.44)
		(4,799,369,706.68)	**(4,192,672,540.13)**
සංචිත			
ප්‍රාග්ධන සංචිත	L1	2,782,868,702.37	2,782,868,702.37
පොදු සංචිත/ රාජ්‍ය ප්‍රධාන	L2	1,676,360,638.70	1,162,270,594.33
		4,459,229,341.07	**3,945,139,296.70**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ප්‍රතිපාදන	L3	624,741,404.18	610,704,923.31
බැංකු ණය	L3	100,867,026.92	116,951,431.45
		725,608,431.10	727,656,354.76
ජංගම වගකීම්			
පාරිතෝෂික දීමනා	L4	512,668,406.22	418,598,739.68
පොලි දරණ ණය ගැනීම	L5	236,845,418.94	233,038,928.53
ණය භිමිබදු	L6	15,242,210.19	19,540,273.69
තැරැව්කරු අත්තිකාරම්	L7	19,759,872.80	93,924,942.10
ගෙවියයුතු වෙළඳ	L8	595,183,623.52	549,738,044.82
සේ.අ.අ./ව.සේ.අ.අ./ලං.හා.අ.ද	L9	906,154,103.37	840,888,990.87
සේ.හා.අ.සහ වෙනත් ගෙවියයුතු මමුදල්	L10	32,367,336.73	26,441,309.78
කැන්පතු බදු දේපල අත්තිකාරම්	L11	137,069,289.03	119,083,732.39
බංකු අයිරා	L12	76,869,978.49	86,643,933.43
		2,532,160,239.29	2,387,898,895.29
මුළු ස්කන්ධය හා වගකීම්		**2,917,628,304.78**	**2,868,022,006.62**

ප්‍රධාන ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත් කිරීම් සම්බන්ධව ජනවසම අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරණ අතර, ජනවසම අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබා ඇත.

සභාපති

අධ්‍යක්ෂ:

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2016 12.31 දිනෙන් අවසන වර්ෂය සඳහා ආදායම් වාර්තාව

	සටහන අංක	2016 රු.	2015 රු.
ආදායම්	1	494,938,119.91	584,772,523.65
වෙළඳ ව්යදම්	2	893,804,172.76	1,011,866,874.99
දළ මෙහෙයුම් ලාභය/(අලාභය)	3	(398,866,052.85)	(427,094,351.34)
වෙනත් ආදායම්	4	76,650,747.03	220,696,252.99
දළ ලාභය /(අලාභය)		**(322,215,305.82)**	**(206,398,098.35)**
ව්යදම්			
පරිපාලන ව්යදම්	5	26,825,392.00	26,178,859.47
කාර්ය මණ්ඩල ව්යදම්	6	105,544,231.68	94,617,984.41
ඒකුණුම් හා අලෙවි ව්යදම්	7	976,080.79	292,814.60
වතුවල වෙනත් ව්යදම්	8	77,156,042.21	76,362,553.60
		210,501,746.68	197,452,176.08
මූල්‍ය ව්යදමට පෙර ලාභය/(අලාභය)		**(532,717,052.50)**	**(403,850,274.43)**
මූල්‍ය ව්යදම්	9	31,243,961.23	39,682,028.30
		(563,961,013.73)	(443,532,302.73)
බදු වලට පෙර ලාභය/(අලාභය)		(563,961,013.73)	(443,532,302.73)

පහනා වතු සංවර්ධනා මණ්ඩලය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට මුල්‍ය ප්‍රවාහය

රු.

කාරක ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය			
වසරේ ශුද්ධ ලාභය/(අලාභය)			(563,961,013)
ගැලපුම් දීමනාව			
විශ්‍රාමොපරිමෝෂික සඳහා ප්‍රතිපාදන	40,639,179		
පාරිනෝෂික ගෙවීම	(8,425,958)	32,213,221	
ප්‍රසාධ දීමනා ප්‍රතිපාදන	2,372,806		
ප්‍රසාධ දීමනා ගෙවීම	(2,979,183)	(606,377)	
ක්ෂය වීම්		32,732,929	
මුල්‍ය වියදම්		6,561,418	
පොළී ආදායම්		71,130	
සේ.අ.අ. සඳහා අයිතාරය		71,598,521	142,570,842
කාරක ප්‍රාග්ධනය වෙන් කිරීමට පෙර මෙහෙයුම් ලාභය			(421,390,171)
<u>ඉයිතුම්වල් වෙනස්කම් සඳහා කාරක ප්‍රාග්ධන</u>			
ගංඥව ලැයිස්තුව		(30,880,991)	
වෙළඳ හා වෙනත් ලැයිම්		(20,078,969)	
වෙළඳ හා වෙනත් ගෙවීම්		45,445,579	
බදු දුන් දේපළ		(4,298,063)	
ණය සඳහා පොළී		3,806,490	
කැන්පතු අත්තිකාරම්		17,985,557	
සේ.අ./සේ.නි. විවිධ ගෙවීම්		71,191,140	
තැ.ව.කාර අත්තිකාරම්		(74,165,070)	9,005,673
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය			(412,384,498)
<u>ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය</u>			
භාණ්ඩාගාර ප්‍රධාන		511,689,820	
රබර් වගාව සඳහා සහනාධාර		2,400,224	
ක්ෂේත්‍ර සංවර්ධන වියදම්		2,358,556	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්		1,000,000	
කෝෂ්ඨ සංවර්ධන වියදම්		(48,493,473)	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්		(22,931,087)	
ශුද්ධ මුල්‍ය ආයෝජන සඳහා මුල්‍ය ප්‍රවාහය			446,024,040
<u>මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා මුල්‍ය ප්‍රවාහය</u>			
ණයට ගැනීම් සම්බන්ධයෙන් ගෙවීම්		(15,150,616)	
ණය සඳහා ආපසු ගෙවීම්		(2,479,352)	
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් වූ මුල්‍ය ප්‍රමාණයන්			(17,629,968)

මුදල් හා මුදල් සමාන වටිනාකම් වල ශුද්ධවැඩිවීම/ අඩුවීම	16,009,574
ආරම්භක මුදල් හා මුදල් සමාන වටිනාකම	(82,220,422)
අවසාන මුදල් හා මුදල් සමාන වටිනාකම	(66,210,848)

සටහන්

ආරම්භක මුදල් හා මුදල් සමාන වටිනාකම

අතැති මුදල් හා බැංකු ශේෂය	4,423,511
බැංකු අයිරා	(86,643,933)
	(82,220,422)

අවසන් මුදල් හා මුදල් සමාන වටිනාකම

අතැති මුදල් හා බැංකු ශේෂය	10,659,130
බැංකු අයිරා	(76,869,978)
	(66,210,848)

ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පැහැදිලි 2016

	2016.1.1දිනට ඇත්තය	වසර තුළ එකතුවූ	මාරු කිරීම්/ ඇපකර කිරීම්	2016.12.31 දිනට ඇත්තය
	රු.	රු.	රු.	රු.
1 වැඩිදියුණු කොකල ඉඩම් සැවැත් පරිහරණ වැටිලිහා වෙනත් වත්කම්	27,557,464.50	-		27,557,464.50
2 දීඝකාල ඉඩම් මාර්ග හා සැලසුම් උපයෝ නිවාස හා වැසිකිළි සොඩනැගිලි ගබඩා	1,620,713,985.43	154,500.00		1,620,868,485.43
3 පරිහරණ කොටු වැටිලි	251,449,475.89	30,214,187.35	(18,218,710.27)	263,444,952.97
4 පරිහරණ වැටිලි	439,724,808.99	18,279,286.36		458,004,095.35
5 යන්ත්‍රසූත්‍ර කාර්යාල උපකරණ හා රථ වාහන	255,397,164.42	485,920.00		255,883,084.42
6 පරිගණක හා මෘදුකාංග යන්ත්‍ර	4,564,465.10	251,250.00		4,815,715.10
7 ලී බඩු හා පරිකිර්ම	5,384,971.06	64,656.05		5,449,627.11
8 ජල සම්පාදන යෝජනා ක්‍රම හා කුඩා ජල විදුලි යෝජනා ක්‍රම සහ අත්කම් නිවාස	16,597,189.72	-		16,597,189.72
9 ආරක්ෂිත විදුලි ආලෝක වැට හා ඕනිවිරියා වහාව	655,481.84	-		655,481.84
10 උතුරලේඛිය වත්කම් ස්ථාවර වත්කම් කොන්ම ප්‍රාග්ධන වැඩ	35,968,388.10	21,974,761.49	(28,504,580.99)	29,438,568.60
	2,658,013,395.05	71,424,561.25	(46,723,291.26)	2,682,714,665.04

B සමුච්චිත ක්ෂය නිරීම

	2016.1.1දිනට ඇත්තය	වර්ෂය තුළ ක්ෂය කළහා	ඉවත් කිරීම් මත ක්ෂය	2016.12.31 දිනට ඇත්තය
	රු.	වෙන්කිරීම් රු.	රු.	රු.
1 වැඩිදියුණු කොකල ඉඩම් සැවැත් පරිහරණවැටිලි හා වෙනත් වත්කම්	24,926,939.56	-		24,926,939.56
2 දීඝකාල ඉඩම් මාර්ග සැලසුම්ගත කිරීම නිවාස හා වැසිකිළි ගොඩනැගිලි හා ගබඩා	143,818,011.94	1,421,799.58		145,239,811.52
3 පරිහරණ කොටු වැටිලි	-	-		-
4 පරිහරණ වැටිලි	83,809,107.15	16,842,616.29	-	100,651,723.44
5 යන්ත්‍ර සූත්‍ර කාර්යාල උපකරණ හා රථවාහන	188,855,619.94	12,647,735.73		201,503,355.67
6 පරිගණක හා මෘදුකාංග යන්ත්‍ර	1,016,456.22	527,252.25		1,543,708.47
7 ලී බඩු සහ පරිකිර්ම	4,170,338.13	41,372.06		4,211,710.19
8 ජල සම්පාදන යොජනා ක්‍රම හා කුඩා ජල විදුලි යෝජනා ක්‍රම සහ අත්කම් නිවාස	4,389,660.25	808,573.47		5,198,233.72
9 ආරක්ෂිත විදුලි ආලෝක වැට හා ඕනිවිරියා වහාව	434,887.90	1,200.00		436,087.90
	451,421,021.09	32,290,549.38	-	483,711,570.47

C ශ්‍රීයාහල අගය

	01.01.2016	31.12.2016
1 වැඩිදියුණු කොකල ඉඩම් සැවැත් පරිහරණවැටිලි හා වෙනත් වත්කම්	2,630,524.94	2,630,524.94
2 දීඝකාලඉඩම් මාර්ග සැලසුම්ගත කිරීම නිවාස හා වැසිකිළි ගොඩනැගිලි හා ගබඩා	1,476,895,973.49	1,475,628,673.91
3 පරිහරණ කොටු වැටිලි	251,449,475.89	263,444,952.97
4 පරිහරණ වැටිලි	355,915,701.84	357,352,371.91
5 යන්ත්‍ර සූත්‍ර කාර්යාල උපකරණ හා රථවාහන	66,541,544.48	54,379,728.75
6 පරිගණක හා මෘදුකාංග යන්ත්‍ර	3,548,008.88	3,272,006.63
7 ලී බඩු සහ පරිකිර්ම	1,214,632.93	1,237,910.92
8 ජල සම්පාදන යොජනා ක්‍රම හා කුඩා ජල විදුලි යෝජනා ක්‍රම සහ අත්කම් නිවාස	12,207,529.47	11,398,956.00
9 ආරක්ෂිත විදුලි ආලෝක වැට හා ඕනිවිරියා වහාව	220,593.94	219,393.94
10 උතුරලේඛිය වත්කම් ස්ථාවර වත්කම් කොන්ම ප්‍රාග්ධන වැඩ	35,968,388.10	29,438,568.60
	2,206,592,373.96	2,199,003,094.57

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2016.12.31 දිනට ස්ථාවර නොවන වත්කම් පිළිබඳ පරීක්ෂණ

පරීක්ෂණ FA - 1

වැඩී දියුණු නොකළ පරීක්ෂණ වැඩිලි සහ වෙනත් පැවරූ වත්කම

	වැඩී දියුණු නොකළ	පරීක්ෂණ වැඩිලි	පැවරූ වෙනත්	එකතුව
	ඉඩම්		වත්කම්	
	රු.	රු.	රු.	රු.
A 2016.01.01 දිනට ශේෂය	935,508.75	17,925,651.57	8,696,304.18	27,557,464.50
වසර තුල එකතුවූ				
වසර තුල බැහැර කල				
31.12.2016 දිනට ශේෂය	935,508.75	17,925,651.57	8,696,304.18	27,557,464.50

	වැඩී දියුණු නොකළ	පරීක්ෂණ වැඩිලි	පැවරූ වෙනත්	එකතුව
	ඉඩම්		වත්කම්	
	රු.	රු.	රු.	රු.
B පසුවීත ක්ෂය නිරීම				
2016.01.01 දිනට ශේෂය	-	18,520,206.06	6,406,733.50	24,926,939.56
මෙම වසර දක්වා ක්ෂය කිරීම	-	-	-	-
මෙම වසර තුල ක්ෂය කිරීම	-	-	-	-
31.12.2016 දිනට ශේෂය	-	18,520,206.06	6,406,733.50	24,926,939.56
2016.12.31 දිනට පොතේ පදනම් අගය / ලියාපදිංචි අගය	935,508.75	(594,554.49)	2,289,570.68	2,630,524.94
2015.12.31 දිනට පොතේ පදනම් අගය / ලියාපදිංචි අගය	935,508.75	(594,554.49)	2,289,570.68	2,630,524.94

2 ඇමුණුම FA - 2

ඵලදායී ඉඩම්, ඕඩිය හා යාඵල

ලබාදී තිබීම සහ වැඩිකිරීම්, අතඩිනෑගිරි, තම්බඩ

	ඵලදායී ඉඩම්	ඕඩිය හා යාඵල	ලබාදී සහ වැඩිකිරීම්	අතඩිනෑගිරි	තම්බඩ	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
A 2016.01.01 දිනට ශේෂය	283,112.78	18,446,109.83	62,089,787.75	1,539,765,345.07	129,630.00	1,620,713,985.43
වසර තුල එකතුවූ	-	-	-	154,500.00	-	154,500.00
වසර තුල බැහැර කළ	-	-	-	-	-	-
2016.12.31 දිනට ශේෂය	283,112.78	18,446,109.83	62,089,787.75	1,539,919,845.07	129,630.00	1,620,868,485.43
B සමුච්චිත ක්ෂය හිමිව						
2016.01.01 දිනට ශේෂය	-	3,175,945.45	25,318,713.69	115,323,352.80	-	143,818,011.94
කම්කරුවන් වදාගෙ ක්ෂය හිමිව	-	562,712.87	223,042.07	636,044.64	-	1,421,799.58
මෙම වසර තුල ක්ෂය හිමිව	-	-	-	-	-	-
